# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2018

## දේශීය වෛද්‍ය අංශය

## சுதேச மருத்துவப் பிரிவு

## Indigenous Medicine sector






## දැක්ම

හෙළ වෙදකමින් සැමට සුවසෙත

## මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික, ආර්ථික හා සහස්‍ර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ප්‍රබල අයුරින් දායක කරවීම



# පෙළ ගැස්ම


| | | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 3 |
| 2. | දේශීය වෛද්‍ය අංශයේ ප්‍රමුඛතා | 4 |
| 3. | දේශීය වෛද්‍ය අංශය හා ඒ යටතේ ඇති ආයතන | 5 |
| 4. | දේශීය වෛද්‍ය අංශයේ මූල්‍ය ප්‍රගතිය | 6 |
| 5. | ආයතන හා පාලන අංශය | 7 |
| 6. | දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය | 10 |
| 7. | දේශීය වෛද්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම | 14 |
| 8. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 15 |
| 8.1 | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය | 38 |
| 8.2 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | 41 |
| 8.3 | ආයුර්වේද වෛද්‍ය සභාව | 42 |
| 8.4 | ආයුර්වේද ඔසු උයන් | 44 |
| 8.5 | අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය | 49 |
| 9. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 51 |
| 10. | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය | 58 |
| 10.1 | හෝමියෝපති රෝහල | 59 |
| 10.2 | හෝමියෝපති වෛද්‍ය සභාව | 62 |

## 01. හැඳින්වීම

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට පෙර පැවති වෛද්‍ය ක්‍රමය වූයේ පාරම්පරිකව පැවත ආ දේශීය චිකිත්සාව හෙවත් පාරම්පරික සිංහල වෙදකමයි. ශ්‍රී ලංකාව වෙත බුදු දහම සම්ප්‍රාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අපට දායාද විය. ඒ අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උතුරු ඉන්දීය ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය අරාබි යුනානි වෛද්‍ය සම්ප්‍රදාය සහ ශ්‍රී ලංකාවේ පාරම්පරික දේශීය චිකිත්සා ක්‍රමය යන සියල්ලෙහි සංකලනයක් ලෙසින් දේශීය වෛද්‍ය ක්‍රමය ස්ථාපිත වී ඇත. එසේ වුවද ශ්‍රී ලංකාව ස්වකීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ආවේණික සම්ප්‍රදායක් තුළ පවත්වා ගෙන යන අනන්‍ය වෛද්‍ය විද්‍යාවක් ලෙස පිළිගෙන තිබේ.

ආයුෂ පවත්වා ගෙන යාමේ විද්‍යාව යනු ආයුර්වේදය යන්නෙහි අදහසයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය රෝග නිවාරණය පදනම් කර ගත්තකි. එහි ප්‍රතිකාර ක්‍රම මෙන්ම ඇවතුම් පැවතුම් ක්‍රම හා වත් පිළිවෙත් ද පවතී. හුදෙක් රෝගයකට ප්‍රතිකාර කිරීමට වඩා රෝගයන්ට ගොදුරු නොවන පරිදි කායිකව හා මානසිකව සුවදායී සෞඛ්‍යමත් ජීවිතයක් පවත්වා ගෙන යාම ආයුර්වේදය මඟින් අදහස් කෙරේ.

ඓතිහාසික ග්‍රන්ථ හා පුරා විද්‍යාත්මක සාධක යනාදිය මඟින් ශ්‍රී ලංකාවේ දියුණු, එමෙන්ම විධිමත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් පැවති බව සනාථ කරයි. ආරෝග්‍ය ශාලා ඉදිකර, ඖෂධ හා ආහාර පාන වැනි දෑ සම්පාදනය කිරීම පිළිබඳව මහාවංශයෙහි තොරතුරු දැක්වේ. එමෙන්ම ඉපැරණි ආරෝග්‍ය ශාලාවන් සහ වෛද්‍ය මෙවලම් හා උපකරණවල නෂ්ඨාවශේෂ මිහින්තලේ, මැදිරිගිරිය, ආළාහණ පිරිවෙණ ආදී ස්ථාන වලින් හමුවී තිබේ,

දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන මෙම මහඟු වෙදකමේ උන්නතිය හා ව්‍යාප්තිය සඳහා කටයුතු සම්පාදනය කරන ලද්දේ නිදහසින් පසුවයි. 1949 අංක 49 දරණ ව්‍යවස්ථාව මඟින් ස්වදේශීය ආඥා පනත සංශෝධනය කිරීම, 1957 ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1961 අංක 31 දරණ ආයුර්වේද පනත සම්මත කර ගැනීම 1980 වසරේ දේශීය වෛද්‍ය ප්‍රවර්ධනය සඳහා නව අමාත්‍යාංශයක් පිහිටුවීම වැනි සංධිස්ථාන පසු කරමින් 1994 දී මෙය කැබිනට් අමාත්‍යාංශයක් දක්වා වැඩිදියුණු විය. එතැන් පටන් කැබිනට් අමාත්‍යවරයකුගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ මෙම අමාත්‍යාංශය 2015.01.18 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගැනුණු අතර 2015.09.21 දින සිට මේ දක්වා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

සුව කිරීමට අසීරු බොහෝ රෝගයන්ට පවා සාර්ථක පිළියම් ලබාදීමට දේශීය වෙදකමට හැකියාව ලැබී ඇත. ශ්‍රී ලංකාවේ පමණක් නොව දේශ දේශාන්තරයන්හි පවා මෙම මහඟු වෙදකම පිළිගත් වෛද්‍ය ක්‍රමයක් බවට පත්ව ඇත්තේ එහෙයිනි.

වර්තමානයේ නව පර්යේෂණ ක්‍රම ඔස්සේ යමින් දේශයේ සෞඛ්‍ය සංරක්ෂණය උදාකරලීම සඳහා දේශීය වෛද්‍ය අංශය පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.
- දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහළ දැමීම.
- සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය රටේ සංවර්ධනයට දායක කර ගැනීම.
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනයක් ඇති කිරීම.

## 02. දේශීය වෛද්‍ය අංශයේ ප්‍රමුඛතා අංශ

| විශේෂ අවධානයට ලක්වූ ප්‍රමුඛතා අංශ | ප්‍රතිඵල නිමවුම් දර්ශකය |
|---|---|
| 1. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ නීතිමය රාමුව සවිමත් කිරීම | ■ ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතයේ අක්‍රමිකතා අවම වීම.<br>■ වෘත්තීමය වශයෙන් තෘප්තිමත් ආයුර්වේද වෛද්‍යවරුන් බිහිවීම.<br>■ ආයුර්වේද ප්‍රතිකාර ආයතන නීතිමය පදනමක් මත ශක්තිමත් කිරීම. |
| 2. ආයුර්වේද පර්යේෂණ ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම | ■ ගුණාත්මක භාවයෙන් යුත් නව ආයුර්වේද නිෂ්පාදනවල ප්‍රමාණාත්මක වැඩි වීම.<br>■ ආයුර්වේද පර්යේෂකයින්ගේ අයිතීන් තහවුරු වීම.<br>■ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ පිළිගැනීම පුළුල් වීම.<br>■ ආයුර්වේද පර්යේෂණ හා පර්යේෂකයින් සඳහා වැඩි අවස්ථාවන් සැළසීම.<br>■ බෝ නොවන රෝග පාලනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රම හඳුන්වා දීම.<br>■ සංරක්ෂණය වූ පාරම්පරික ආයුර්වේද ලේඛන ප්‍රමාණය ඉහළ යාම.<br>■ ආයුර්වේදයට සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන් සුරක්ෂිත වීම හා විධිමත් වීම.<br>■ තෘප්තිමත් ආයුර්වේද වෛද්‍ය සේවාවක් ස්ථාපිත වීම. |
| 3. ආයුර්වේදය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම | ■ යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් නිර්මාණය වීම.<br>■ ක්‍රමවත් ජාලගත මෙහෙයුම් පද්ධතියක් නිර්මාණය වීම.<br>■ ඊ - ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් නිර්මාණය වීම.<br>■ දේශීය වෙදකමේ නිම් වළලු පුළුල් වීම. |
| 4. ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණය යාවත්කාලීන හා වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය | ■ ගුණාත්මක භාවයෙන් යුත් මානව සම්පත ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>■ වෘත්තීමය වශයෙන් තෘප්තිමත් මානව සම්පත වැඩි වීම.<br>■ දේශීය වෛද්‍ය ක්‍රමය සඳහා ඇති ගෝලීය ඉල්ලුම සැපිරිය හැකි වීම.<br>■ පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම හා කුසලතාවය නූතන සමාජ අවශ්‍යතාවය උදෙසා යාවත්කාලීන වීම.<br>■ නිපුණතාවයෙන් යුත් දේශීය වෛද්‍යවරු ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>■ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතා කරන්නන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු වී තිබීම. |
| 5. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ඖෂධීය පැලෑටි වගා කිරීම, වැඩිදියුණු කිරීම සහ ඔසු උයන් ආරම්භ කිරීම | ■ ඉහළ ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක ඖෂධ ප්‍රමාණය වැඩිවීම.<br>■ ආයුර්වේදය තුළින් ආදායම් උත්පාදනය ඉහළ යාම.<br>■ ආයුර්වේද ඖෂධ සඳහා ඇති විදේශීය වෙළඳ පොළ අවස්ථා ඉහළ යාම.<br>■ භාවිතයට පහසු ඖෂධ නිෂ්පාදනය ඉහළ යාම. |
| 6. ආයුර්වේදය වාණිජකරණය අනුව පවත්වාගෙන යාම | ■ පාරම්පරික වෙදකම, ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත වීම.<br>■ විශේෂිත වූ ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සැපයීමට හැකිවන පරිදි නවීන පහසුකම් සහිත රෝහල් ඇති වීම.<br>■ පවතින ඔසු උයන් හා නව ඔසු උයන් උසස් තත්ත්වයට පත් වීම. |
| 7. හෝමියෝපති වෛද්‍ය ක්‍රම භාවිතය ඉහළ නැංවීම | ■ සේවාලාභීන් සඳහා වූ තෘප්තිමත් හෝමියෝපති වෛද්‍ය සේවාවක් ස්ථාපිත කිරීම.<br>■ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත ආයතන විධිමත් ලෙස ස්ථාපිත වීම.<br>■ වෘත්තීමය වශයෙන් තෘප්තිමත් හෝමියෝපති මානව සම්පතක් ඇති වීම. |

## 03. දේශීය වෛද්‍ය අංශය යටතේ ඇති ආයතන



## 04. දේශීය වෛද්‍ය අංශය - 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය

| කාණ්ඩය/වැය විෂයය/අයිතමය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| **පුනරාවර්තන** | **250,946,848.50** | **220,592,502.76** | **87.90** |
| සාමාන්‍ය පරිපාලනය / වෙනත් වැඩසටහන් | 211,946,848.50 | 184,678,568.93 | 87.13 |
| <u>ආයතන සේවා</u><br>රාජ්‍ය ආයතන | | | |
| i. හෝමියෝපති වෛද්‍ය සභාව | 16,000,000.00 | 15,632,730.28 | 97.70 |
| ii. පෝෂණ වැඩසටහන් | 5,000,000.00 | 4,853,249.50 | 97.06 |
| | 21,000,000.00 | 20,485,979.78 | 97.55 |
| • හෝමියෝපති රෝහල | 18,000,000.00 | 15,427,954.05 | 85.71 |
| **ප්‍රාග්ධන** | **179,021,469.00** | **99,185,141.97** | **55.40** |
| **සාමාන්‍ය පරිපාලනය** | 2,502,910.00 | 1,765,386.25 | 70.53 |
| විශේෂ වැඩසටහන් | | | |
| • ඖෂධ සංස්ථාව | 100,000,000.00 | 47,000,000.00 | 47.00 |
| • සංරක්ෂණ සභා | 7,000,000.00 | 5,740,278.61 | 82.00 |
| • හෝමියෝපති වෛද්‍ය සභාව | 2,500,000.00 | 1,824,409.02 | 72.98 |
| • හෝමියෝපති ක්‍රම සංවර්ධනය | 30,000,000.00 | 7,135,882.55 | 23.79 |
| • පෝෂණ මන්දිර ස්ථාපනය කිරීම | 7,000,000.00 | 5,900,626.54 | 84.29 |
| • ඔසු උයන් සඳහා නළ ළිං | 2,836,659.00 | 2,836,659.00 | 100.00 |
| අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල් ගෙවන වාට්ටු සංකීර්ණය වැඩ නිම කිරීම | 27,181,900.00 | 26,981,900.00 | 99.26 |
| **මුළු එකතුව** | **429,968,317.50** | **319,777,644.73** | **74.37** |

**05.** ආයතන හා පාලන අංශය
**2018.12.31 දිනට**

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | පන්තිය/ ශ්‍රේණිය | වැටුප් කේතය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | අතිරේක ලේකම් (පාලන) | SLAS | විශේෂ | SL3-2016 | 01 | 01 | - |
| 02 | අතිරේක ලේකම් (සංවර්ධන) | SLAS | විශේෂ | SL3-2016 | 01 | 01 | - |
| 03 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | SLAS | I | SLI-2016 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ (සංවර්ධන) | SLAS | I | SLI-2016 | 01 | 01 | - |
| 05 | අධ්‍යක්ෂ (සැලසුම්) | SLPS | I | SLI-2016 | 01 | 01 | - |
| 06 | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS | I | SLI-2016 | 01 | 01 | - |
| 07 | අභ්‍යන්තර විගණක | SLAcS | III/II | SLI-2016 | 01 | - | 01 |
| 08 | ගණකාධිකාරී | SLAcS | III/II | SLI-2016 | 01 | 01 | - |
| 09 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | SLAS | III/II | SLI-2016 | 01 | - | 01 |
| 10 | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | SLPS | III/II | SLI-2016 | 01 | 01 | - |
| 11 | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශිල්පීය වෛද්‍ය) | SLAyMS | III/II | SLI-2016 | 01 | 01 | - |
| 12 | සහකාර ලේකම්(පාලන) | SLAS | III | SLI-2016 | 01 | - | 01 |
| 13 | නීති නිලධාරී | Dept | III/II | SLI-2016 | 01 | - | 01 |
| 14 | පරිපාලන නිලධාරී | PMAS | Supra | MN7-2016 | 01 | 01 | - |
| 15 | භාෂා පරිවර්තක | TS | | MN6-2016 | 01 | - | 01 |
| 16 | සංඛ්‍යාලේඛන නිලධාරී | | | MN5-2016 | 01 | 01 | - |
| 17 | සංවර්ධන නිලධාරී | DOS | | MN4-2016 | 336 | 208 (ප්‍රා.ලේ.) 10 (ප්‍ර.කාර්යාලය) | 118 |
| 18 | සංවර්ධන සහකාර | ASSO.Officer | | MN4-2016 | 08 | 08 | - |
| 19 | සැපයුම් සහකාර | ASSO.Officer | | MN4-2016 | 02 | 01 (හෝමියෝපති රෝහල) | 01 |
| 20 | සංඛ්‍යාලේඛන සහකාර | ASSO.Officer | | MN4-2016 | 01 | 01 | - |
| 21 | අයවැය සහකාර | ASSO.Officer | | MN4-2016 | 01 | - | 01 |
| 22 | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | III/II/I/Sp | MN2-2016 | 23 | 16 | 07 |
| 23 | වීඩියෝ කැමරාකරු | Dept | | MT2-2016 | 01 | 01 | - |
| 24 | නිශ්චල ඡායාරූප ශිල්පී | Temporary | | PL3-2016 | 01 | - | 01 |
| 25 | රියදුරු | DS | | PLI-2016 | 14 | 05 | 09 |
| 26 | කැමරා සහායක | Dept | | PLI-2016 | 01 | - | 01 |
| 27 | කාර්යාල කාර්ය සහායක | OES | | PLI-2016 | 14 | 08 | 06 |
| 28 | කම්කරු | Dept | | PLI-2016 | 01 | 01 | - |

**දේශීය වෛද්‍ය අංශය මඟින් ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන්**

**I. දේශීය**

| අනු අංකය | විස්තරය | පුහුණු ආයතනය | සහභාගී වූ සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය නිලධාරියකුගේ කාර්යක්ෂමතාව කෙරෙහි ආහාර හා පෝෂණයේ වැදගත්කම | දේශීය වෛද්‍ය අංශය | 70 | 8,185.00 |
| 02. | කාර්ය පරිපාටි රීති හා ආයතන සංග්‍රහය | දේශීය වෛද්‍ය අංශය | 50 | 4,685.00 |
| 03. | කාර්යාල උපකරණ පාලනය පිළිබඳ වැඩමුළුව | Skills Development fund | 02 | 17,000.00 |
| 04. | සාර්ථක වෘත්තීය ජීවිතයකට ධනාත්මක ආකල්ප | දේශීය වෛද්‍ය අංශය | 60 | 10,045.00 |
| 05. | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ දෙදින වැඩමුළුව | Skills Development fund | 01 | 8,500.00 |
| 06. | සාර්ථක ජීවිතයක් සඳහා කළමනාකරණ මඟ පෙන්වීම | දේශීය වෛද්‍ය අංශය | 50 | 2,443.75 |
| 07. | Diploma in Public Procurement and Contract Administration | Miloda Academy of financial studies | 01 | 100,000.00 |
| 08. | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන 2018 | දේශීය වෛද්‍ය අංශය | 60 | 37,280.00 |
| | **එකතුව** | | | **188,138.75** |

**II. විදේශීය**

| පුහුණුවේ නම | පුහුණු ආයතනය/රට | කාලය | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|
| BIMSTEC Conference on the Protection of Traditional Knowledge and Genetic Resources | තායිලන්තය | 2018 මැයි 21,22 | අතිරේක ලේකම් (සංවර්ධන)-දේශීය වෛද්‍ය අංශය |
| BIMSTEC Conference on the Protection of Traditional Knowledge and Genetic Resources | තායිලන්තය | 2018 මැයි 21,22 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශිල්පීය වෛද්‍ය) - දේශීය වෛද්‍ය අංශය |
| WHO- Expert for upcoming working group meetings to Develop WHO Documents on Benchmark for practice in Ayurveda/ Unani/ Panchakarma | ඉන්දියාව | 2018 සැප්තැම්බර් 17-19 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශිල්පීය වෛද්‍ය) - දේශීය වෛද්‍ය අංශය |
| WHO- Expert for upcoming working group meetings to Develop WHO Documents on Benchmark for practice in Ayurveda/ Unani/ Panchakarma | ඉන්දියාව | 2018 සැප්තැම්බර් 17-19 | අධ්‍යක්ෂ,ආයුර්වේද පර්යේෂණ රෝහල, නින්දවූර් |
| Training Programme on 'Diversity' Documentation Genc Banking and Data Base for Medical Plants for IORA Member Countries | ඉන්දියාව | 2018 නොවැම්බර් 25- දෙසැම්බර් 01 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල |
| 8th World Ayurveda Congress and Arogya Expo- 2018 | ඉන්දියාව | 2018 දෙසැම්බර් 14-17 | ආයුර්වේද කොමසාරිස්, නියෝජ්‍ය අධ්‍යක්ෂ(ශිල්පීය වෛද්‍ය), ආයුර්වේද වෛද්‍ය නිලධාරී |
| Capacity Bulding Training Programme | Malayasia | 07 Days | 01 |

**සකස් කරන ලද අණපනත් හා ව්‍යවස්ථා**

- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ , සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/4/2/37/1(1)/2012 දිනැති 2018.12.07 ලිපිය මඟින් කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත යොමු කර ඇත.

- ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කටයුතු අවසන් අදියරේ පවතී.

## 06. දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය

### 6.1 ආයුර්වේද ජීවන දර්ශනය සහ පෝෂණය - දේශීය ආහාර රටාව තුළින් බෝ නොවන රෝග පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

**වැඩසටහන් අරමුණු**

- දේශීය ආහාර වල ඖෂධීය වටිනාකම පිළිබඳ දැනුවත් කිරීම
- මාතෘ හා ළමා පෝෂණය සම්බන්ධව දැනුවත් කිරීම.
- ප්‍රජාවගේ අපේක්ෂිත යහපත් සෞඛ්‍යමය චර්යාත්මක වෙනස්වීම් ඉලක්කගත වන සේ වැඩසටහන් සකස් කිරීම හා අන්තර් සන්නිවේදනය.
- පෝෂණ අවශ්‍යතාවයන් පිළිබඳ ස්වයං තක්සේරුවක යෙදීමට ප්‍රජාවට ප්‍රමාණවත් දැනුමක් ලබාදීම
- වකුගඩු රෝග වැනි කාලීන රෝග තත්ත්වයන්ගෙන් ප්‍රජාව වළක්වා ගැනීමට සෞඛ්‍ය සංරක්ෂණ උපාය මාර්ග පහදා දීම හා දායකත්වයක් දැක්වීම
- දේශීය ආහාර සැකසීම, වියැකී යන දේශීය ආහාර සංස්කෘතිය නැවත ස්ථාපනය උදෙසා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රායෝගික වැඩසටහන් සිදු කිරීම

පෝෂණ වැය ශීර්ෂය සඳහා රු.මිලියන 5ක් වෙන්වූ අතර ඒ යටතේ 2018.01.01 සිට 2018.12.31 දින දක්වා රු. 4,997,794.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාදීමට කටයුතු කර ඇත. එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා අනුයුක්ත දේශීය වෛද්‍ය සංවර්ධන නිලධාරීන් 200 දෙනෙකු මඟින් ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශය වෙත ගෙන්වා විධිමත් ඇගයීමකින් පසු ප්‍රතිපාදන වෙන්කරනු ලබයි. එහිදී විශේෂයෙන් ව්‍යාපෘති මාතෘකාව, ඉලක්කගත ප්‍රජාව, හා ඇස්තමේන්තු සැකැස්ම හා එයින් ඇතිවන සමාජමය ප්‍රතිලාභය තියුණු ලෙස විමර්ශණය කරයි.

පෝෂණය පිළිබඳ දැනුවත් කිරීම උදෙසා කොට්ඨාශයට අනුයුක්ත ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණයකින් දේශීය වෛද්‍ය සංවර්ධන නිලධාරීන් මෙම කටයුතු මෙහෙයවන අතර ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ වැඩසටහන අධීක්ෂණය කරයි. යම් පෝෂණ වැඩසටහනක් අවසන් වූ පසු එහි ප්‍රගතිය අමාත්‍යාංශය වෙත එවිය යුතු අතර අනතුරුව දේශීය වෛද්‍ය අංශයේ අතිරේක ලේකම් හා අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කිරීම සිදුවේ.

**ප්‍රතිලාභ**

- ළමා පෝෂණය වැඩිහිටි පෝෂණය සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ සිදු කර ඇති පර්යේෂණයන් සහ වැඩසටහන් ඉතා ගැඹුරින් සළකා බැලීමේදී පෙනී යන්නේ සෞඛ්‍ය සංරක්ෂණ උපාය මාර්ග ජනතාව අතරට ගෙන ගොස් දැනුවත් කිරීම තුළින් වඩා ඵලදායී ප්‍රතිඵල ලබා ගත හැකි බවයි. එනම් ප්‍රජාවගේ සහභාගීත්ව සන්නිවේදනය තුළින් පෝෂණ වැඩසටහන් පිළිබඳ මනා අවබෝධයක් ලබා දිය හැකිය. ඒ නිසා පසුගිය වසරක කාලය තුළ පෝෂණ තත්ත්වයන්හි කැපී පෙනෙන වර්ධනයක් දැන ගත හැකි වීම.

- දේශීය ආහාර සංස්කෘතිය රැකගැනීම උදෙසා සාර්ථක ලෙස ප්‍රජාව දැනුවත් කිරීමට හැකිවීම

- වකුගඩු රෝග වැනි බෝ නොවන රෝග පිළිබඳ, වස විස සහිත ආහාර සමාජගතවීමේ ව්‍යසනය පිළිබඳ විශාල වැඩසටහන් ප්‍රමාණයක් සිදු කිරීම මඟින් සෞඛ්‍ය සංරක්ෂණය උදෙසා විශාල දායකත්වයක් දැක්වීමට හැකිවීම.





| අනු අංකය | වැඩසටහන් ප්‍රවර්ගය | වැඩසටහන් ගණන | සහභාගී වූ ප්‍රමාණය | වැය කළ මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු කරන ලද පෝෂණ වැඩසටහන් | 501 | එක් වැඩසටහනකට දළ වශයෙන් 50-100ත් අතර සංඛ්‍යාවක් | 4,687,894.00 |
| 02 | පෝෂණ වැඩසටහන් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය | 19 | | 309,900.00 |
| **එකතුව** | | **520** | | **4,997,794.00** |

### 6.2 පෝෂණ මන්දිර වැඩසටහන

2018 වර්ෂයේ අයවැය මඟින් පෝෂණ මන්දිර ඉදිකිරීම සඳහා රු.මි. 7.0 ක් වෙන් කර තිබූ තිබූ අතර, එම ප්‍රතිපාදන වලින් 2018 වර්ෂයේ අළුතින් පෝෂණ මන්දිර 5 ක් ඉදි කරන ලදී. එම පෝෂණ මන්දිර ඉදිකිරීමටත්, ඒවාට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ලබා ගැනීමට ලබා දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය පහතින් දැක්වේ.

| අනු අංකය | පෝෂණ මන්දිර ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | භෞතික ප්‍රගතිය | විවෘත කර ඇත/නැත |
|---|---|---|---|---|
| 01. | ගිරිබාව | 1,515,728.84 | 100% | නැත |
| 02. | මාස්පොත | 1,070,003.69 | 100% | නැත |
| 03. | කුලියාපිටිය (බටහිර) | 1,309,685.22 | 100% | විවෘත කර ඇත |
| 04. | වාරියපොල | 834,159.04 | 100% | විවෘත කර ඇත |
| 05. | පූජාපිටිය | 688,260.00 | 100% | විවෘත කර ඇත |

එසේම පෙර වර්ෂවල ඉදි කිරීම් ආරම්භ කළ පෝෂණ මන්දිර වල ඉදි කිරීම් අවසන් කිරීමටත්, ඒවාට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීමටත්, 2018 වර්ෂයේ ලද ප්‍රතිපාදන වලින් නිකුත් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කාරණය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| 01. | ගලේවෙල | නාම පුවරුව සකස් කිරීමට | 5,500.00 |
| 02. | කොබෙයිගනේ | ඉදිකිරීම් අවසන් කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 443,948.68 |
| 03. | අම්පාර | ඉදිකිරීම් අවසන් කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 318,030.00 |
| 04. | ඉංගිරිය | ඉදිකිරීම් අවසන් කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 425,500.00 |
| 05. | බොරැල්ල පෝෂණ මන්දිරය | අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 87,703.91 |
| 06. | තිහගොඩ | ඉතිරි ඉදිකිරීම් වලින් කොටසක් සිදු කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 254,575.18 |

මීට අමතරව, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යන පෝෂණ පියසට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට රු.44,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2018.07.23 දින නිදහස් කර ඇත. ඒ අනුව, 2018 වර්ෂයේ ලද රු.මි.7.0 න් රු.6,997,094.56 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දී ඇත.

## 6.3 ආයුර්වේද සංරක්ෂණ සභා

### 2018.01.01 සිට 2018.12.31 දින දක්වා ප්‍රගතිය

- ❖ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් සඳහා අදාළ ආයුර්වේද සංරක්ෂණ සභා 03 ක වෛද්‍යවරුන්ගේ පරිහරණය වෙනුවෙන් නව පුස්තකාල පහසුකම් ලබා දී ඇත. ඒ සඳහා එක් පුස්තකාලයක් වෙනුවෙන් වානේ අල්මාරියක් සහ දේශීය වෛද්‍ය පොත් මිල දී ගැනීමට රු. 50,000.00 බැගින් අදාළ ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

- ❖ පසුගිය වර්ෂ වල දී පුස්තකාල පහසුකම් ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 49 ක ආයුර්වේද සංරක්ෂණ සභා 49 ක් සඳහා නැවත අදාළ පොත් මිල දී ගැනීමට මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව පුස්තකාල 48 ක් වෙනුවෙන් රු. 20,000.00 බැගින් හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ආයුර්වේද සංරක්ෂණ සභාව වෙනුවෙන් රු. 14,601.18 ලෙස මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

- ❖ ආයුර්වේද සංරක්ෂණ සභා 03 ක් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම වෙනුවෙන් පහත පරිදි අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ආයුර්වේද සංරක්ෂණ සභාව | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| 01 | ඉබ්බාගමුව | ඉබ්බාගමුව | 1,296,663.89 |
| 02 | වැල්ලවාය | වැල්ලවාය | 1,998,693.12 |
| 03 | කොරළෙයිපත්තු (දකුණ) | කොරළෙයිපත්තු (දකුණ) | 2,000,000.00 |

- ❖ ඇහැළියගොඩ ආයුර්වේද සංරක්ෂණ සභාවට අදාළ ඔසු උයනක් නිර්මාණය කිරීම වෙනුවෙන් ආරක්ෂිත වැටක් ඉදි කිරීම සඳහා එම ප්‍රාදේශීය ලේකම් වෙත රු. 440,000.00 ක මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

❖ 2017 වර්ෂයේ ප්‍රතිපාදන මත නිෂ්පාදනය කරන ලද ඖෂධ නිෂ්පාදන උපකරණ 19 ක් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. 140041.84 ක් ප්‍රවාහන වියදම් ලෙස ලබා දී ඇත.



ගනේවත්ත සංරක්ෂණ සහා ගොඩනැගිල්ල



යටියන්තොට පුස්තකාලය

## 6.4 ආයුර්වේද එක්ස්පෝ - 2018

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය සහ අනුග්‍රහය යටතේ අනෙකුත් රාජ්‍ය ආයතනද සමඟ එක්ව ආයුර්වේද එක්ස්පෝ 2018 ජාත්‍යන්තර දේශීය වෛද්‍ය ප්‍රදර්ශනය, සල්පිල හා සම්මන්ත්‍රණය ජූලි මස 13,14 සහ 15 යන දිනයන්හි බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.

දේශීය වෛද්‍ය ක්‍රමය හා ආයුර්වේද නිෂ්පාදනයන්හි විශිෂ්ඨත්වය පිළිබඳව මහජනතාවගේ අවධානය ඉහළනැංවීම හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කිරීම මෙහි අරමුණ වේ.



## 07. දේශීය වෛද්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම

රාජ්‍ය අංශය පරිගණක දැනුම අතින් සන්නද්ධ කිරීම සඳහා වූ ජාතික වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජායතනයෙන් නිකුත් කළ ප්‍රතිපත්ති අංක 101101 හා 101102 යටතේ දේශීය වෛද්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. දේශීය වෛද්‍ය අංශය හා අනුබද්ධ ආයතනවල තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන්ට ඇවැසි උපදෙස් හා සහයෝගය දෙන අතරම දේශීය වෛද්‍ය ක්‍රමයේ දැනුම හා යහපත් සෞඛ්‍ය පුරුදු ලක් වැසි ජනතාවට හා ලෝකවාසී ජනතාව අතර පැතිරවීමේ ඩිජිටල් කාර්යභාරය මෙම අංශයේ ප්‍රධාන කාර්යයි.

1. දේශීය වෛද්‍ය අංශයේ අවශ්‍යතා සඳහා මෘදුකාංග විසඳුම් සැපයීම
2. You tube video sharing පද්ධතියක් සැකසීම
3. දේශීය වෛද්‍ය අංශයේ කාර්යභාරය හා දැනුම ව්‍යාප්ත කිරීම සඳහා සමාජ ජාලා වෙබ් අඩවි තුළ ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම
4. නව තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වා දීම
5. මුද්‍රණ යන්ත්‍ර පොදු භාවිතය
6. අන්තර්ජාල සබඳතා කළමනාකරණය කිරීම
7. LGN. 02. ලබාගෙන සියළුම පරිගණක සඳහා රැහැන් රහිත අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීම
8. ජාල කළමනාකරණය
9. දේශීය වෛද්‍ය අංශයේ විද්‍යුත් තැපැල පවත්වාගෙන යාම
10. පරිගණක දෝෂ නිරාකරණය කිරීම
11. උත්සව හා රැස්වීම් අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම් සැපයීම හා හැසිරවීම
12. දේශීය වෛද්‍ය අංශයේ සියළුම ග්‍රැෆික් නිර්මාණ කටයුතු (පොත් කවර, දැන්වීම්, බැනර් සහ සංයුක්ත තැටි නිර්මාණය කිරීම)

.



# ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 08. ආයුර්වේද දෙපාර්තමේන්තුව



**දැක්ම**

ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත

**මෙහෙවර**

ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාවය සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟා කර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

අයුර්වේද දෙපාර්තමේන්තුව දේශීය වෛද්‍ය අංශයේ කාර්යය භාරය හා මෙහෙවර ඉටු කරන ප්‍රධාන ආයතනය වන අතර 1961 අංක 31 දරණ පනත යටතේ ස්ථාපිත කර ඇත. මෙහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

01. ආයුර්වේදය අනුව රෝග සුව කිරීම, සෞඛ්‍ය සංරක්ෂණය හා රෝග වළක්වාලීම.
02. ආයුර්වේද පර්යේෂණ කාර්යයන් දිරිමත් කිරීම, ආයුර්වේද අධ්‍යාපනය ඔසු වගා සංවර්ධනය, ඔසු නිෂ්පාදනය හා ජනතාව දැනුවත් කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

- පර්යේෂණ හා ශික්ෂණ කටයුතු සඳහා රෝහල් හා අනෙකුත් අංශ පිහිටුවීම හා නඩත්තු කිරීම.
- සම්මන්ත්‍රණ, අභ්‍යාස පන්ති හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම.
- සායනික වෛද්‍ය සේවා හා සාහිත්‍ය පර්යේෂණ පැවැත්වීම.
- ඖෂධීය ශාක වගා කිරීම, සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම.
- දිවයිනේ සියළු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම.
- ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා ආයුර්වේ ඖෂධ නිෂ්පාදන ආයතන හා පෞද්ගලික ආයුර්වේද අධ්‍යාපනයට අදාළ කටයුතු සඳහා නීති හා රෙගුලාසි සකස් කිරීම.

# ආයුර්වේද දෙපාර්තමේන්තුව

- ප්‍රධාන කාර්යාලය
  1. ආයතන සහ පාලන අංශය
  2. ශිල්පීය අංශය
  3. ගිණුම් අංශය
  4. සංවර්ධන අංශය
  5. විභාග අංශය
- ආයුර්වේද ශික්ෂණ රෝහල්
  1. ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
  2. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල -යක්කල
  3. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
  4. සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය
  5. යුනානි ආයුර්වේද රෝහල - මන්වන්තුඩුව
- නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය
- ආයුර්වේද පර්යේෂණ රෝහල්
  1. හම්බන්තොට ආයුර්වේද පර්යේෂණ රෝහල
  2. පාරම්පරික පර්යේෂණ රෝහල, මිහින්තලය
  3. අම්පාර ආයුර්වේද රෝහල
  4. නාවින්න ආයුර්වේද පර්යේෂණ රෝහල
  5. මැදවච්චිය ආයුර්වේද පර්යේෂණ රෝහල
  6. නින්දවූර් ආයුර්වේද පර්යේෂණ රෝහල
- දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
- ඔසු උයන්
  1. ගිරාදුරුකෝට්ටේ
  2. පල්ලේකැලේ
  3. හල්දුම්මුල්ල
  4. පින්නදූව
  5. පට්ටිපොළ
  6. කන්නෙලිය
  7. නාවින්න
  8. මිහින්තලේ
  9. වෙදගම
- අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය

## (1) ආයතන හා පාලන අංශය - ආයතනික කාර්යයන්

<table>
<tr><th>අනු අංකය</th><th>කාර්යය</th><th>සේවක ගණය</th><th>සංඛ්‍යාව</th></tr>
<tr><td rowspan="7">1</td><td rowspan="7">බඳවා ගැනීම්</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්</td><td>650</td></tr>
<tr><td colspan="2">ආයුර්වේද වෛද්‍ය</td></tr>
<tr><td>II ශ්‍රේණිය 2015.03.09 දිනට පත්වීම්</td><td>09</td></tr>
<tr><td>II ශ්‍රේණිය 2016.11.01 දිනට පත්වීම්</td><td>23</td></tr>
<tr><td colspan="2">ඒකාබද්ධ රියදුරු සේවය</td></tr>
<tr><td>I ශ්‍රේණිය</td><td>01</td></tr>
<tr><td>I ශ්‍රේණිය</td><td>01</td></tr>
<tr><td rowspan="8">2</td><td rowspan="8">උසස්වීම් ලබා දීම</td><td>උපස්ථායක</td><td>23</td></tr>
<tr><td>විදුලි කාර්මික</td><td>01</td></tr>
<tr><td>ආහාර නිරීක්ෂක</td><td>01</td></tr>
<tr><td>රසායනාගාර සේවක</td><td>04</td></tr>
<tr><td>ඖෂධ සංයෝජක</td><td>03</td></tr>
<tr><td>ටිකට් ලිපිකරු</td><td>01</td></tr>
<tr><td>සුළු සේවා පාලක</td><td>02</td></tr>
<tr><td>සංචාරක බංගලා භාරකරු</td><td>03</td></tr>
<tr><td rowspan="17">3</td><td rowspan="17">කාර්ය මණ්ඩල අනුමත කිරීම්</td><td colspan="2">BMARI ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය සඳහා බඳවාගැනීමට අනුමත කාර්ය මණ්ඩලය</td></tr>
<tr><td>ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය භාර නිලධාරී</td><td>01</td></tr>
<tr><td>වැඩසටහන් නිෂ්පාදක</td><td>01</td></tr>
<tr><td>තාක්ෂණ නිලධාරී</td><td>01</td></tr>
<tr><td>පරිගණක ක්‍රියාකරු</td><td>01</td></tr>
<tr><td>කැමරා ශිල්පී</td><td>01</td></tr>
<tr><td>වීඩියෝ සංස්කාරක</td><td>01</td></tr>
<tr><td>ශබ්ද සංස්කාරක</td><td>01</td></tr>
<tr><td>ආයුර්වේද සේවා සහායක</td><td>01</td></tr>
<tr><td colspan="2">ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාවේ තනතුරු අනුමත කාර්ය මණ්ඩලය</td></tr>
<tr><td>අධ්‍යක්ෂ</td><td>01</td></tr>
<tr><td>ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී</td><td>22</td></tr>
<tr><td>ලියාපදිංචි දේශීය වෛද්‍ය</td><td>84</td></tr>
<tr><td>රාජ්‍ය කළමනාකරණ සහකාර</td><td>01</td></tr>
<tr><td>ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරී</td><td>210</td></tr>
<tr><td>රියදුරු</td><td>01</td></tr>
<tr><td>කම්කරු</td><td>08</td></tr>
<tr><td rowspan="2">4</td><td rowspan="2">අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය</td><td colspan="2">බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු සංශෝධනය කිරීම</td></tr>
<tr><td>රාජ්‍ය කළමනාකරණ සහකාර</td><td>19</td></tr>
</table>

## දේශීය පුහුණු වැඩසටහන්

| අනු අංකය | පැවැත් වූ ආයතනය හා ස්ථානය | සහභාගී වූ පුහුණු පාඨමාලාව හා සේවක ගණය | කාලය |
|---|---|---|---|
| 01 | ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව | පොත් බැදුම්කරුවන් පුහුණු කිරීම<br>ආයුර්වේද සේවා සහයක | මාස 01 |
| 02 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි පුහුණු පාඨමාලාව<br>රාජ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 01 |
| | | වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ නිලධාරීන් -13 | දින 01 |
| | | පෞද්ගලික ලිපිගොනු ඵලදායි ආකාරයෙන් පවත්නාගෙන යාම<br>ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් -03 | දින 01 |
| | | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සැකසීම<br>ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් -03 | දින 01 |
| | | පිළිගැනීම් නිලධාරීන්ගේ හා දුරකථන ක්‍රියාකරුවන්ගේ කුසලතා වර්ධන දෙදින පුහුණු වැඩසටහන<br>කාර්යාල කාර්යය සහයක -03 | දින 02 |
| | | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය<br>කාර්යාල කාර්යය සහයක -03 | දින 01 |
| | | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි<br>ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් -02 | දින 02 |
| 03 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අධිකාරිය | අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලනය පිළිබඳ වැඩමුළුව<br>සංවර්ධන නිලධාරී -01<br>රාජ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 02 |
| | | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි<br>රාජ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 02 |
| | | අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලනය පිළිබඳ වැඩමුළුව<br>වෛද්‍ය නිලධාරීන් -01<br>සංවර්ධන නිලධාරීන් -01 | දින 02 |
| 04 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | තොරතුරු තාක්ෂණය පිළිබඳ එක්දින වැඩසටහන වෛද්‍ය නිලධාරීන් -04 | දින 01 |
| 05 | මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | රාජ්‍ය නිලධාරීන් සඳහා දෙමළ භාෂා දින 06 (පැය 50) පුහුණු වැඩසටහන<br>ආයුර්වේද සේවා සහයක - 04<br>රියදුරන් -03 | දින 07 |
| 06 | Modern Research & Development Complex, Industrial Technology Institute Maiabe | Training Programme on Essential Oils, Herbal Cosmetics<br>වෛද්‍ය නිලධාරීන් -02 | දින 08 |
| 07 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | Workshop on IT Procurement Management<br>සංවර්ධන නිලධාරීන් -01<br>රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 02 |

විදේශ පුහුණු වැඩසටහන්

<table>
<tr><th>අනු අංකය</th><th>සේවක ගණන</th><th>සහභාගී වූ පාඨමාලාව</th><th>සහභාගී වූ ප්‍රමාණය</th><th>රට</th><th>කාලය</th></tr>
<tr><td>1</td><td>අධ්‍යක්ෂ, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය</td><td rowspan="3">2018 Seminar on Traditional Chinese Medicine for Developing Countries</td><td>01</td><td rowspan="3">චීනය</td><td rowspan="3">දින 18</td></tr>
<tr><td>2</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරී</td><td>04</td></tr>
<tr><td>3</td><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල</td><td>01</td></tr>
<tr><td>4</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරී</td><td>Modernization of Traditional Medicine</td><td>3</td><td>කොරියාව</td><td>දින 23</td></tr>
<tr><td>5</td><td>විශේෂඥ වෛද්‍ය නිලධාරී</td><td>Sithargal Thiruvizha</td><td>1</td><td>ඉන්දියාව</td><td>දින 03</td></tr>
<tr><td>6</td><td>ගණකාධිකාරී (ගිණුම්)</td><td>International Programme on Management Auditing for the Public Sector Internal Auditors</td><td>1</td><td>මැලේසියාව</td><td>දින 07</td></tr>
<tr><td>7</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරී</td><td>Training for Medical Workers from Developing Countries</td><td>1</td><td>චීනය</td><td>මාස 01</td></tr>
<tr><td>8</td><td>සහකාර කොමසාරිස් (ශිල්පීය)</td><td rowspan="2">2018 Seminar on Traditional Chinese Medical Culture for countries Under Belt & Road Initiative</td><td>1</td><td rowspan="2">චීනය</td><td rowspan="2">දින 20</td></tr>
<tr><td>9</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරී</td><td>1</td></tr>
<tr><td>10</td><td>ආයුර්වේද කොමසාරිස්</td><td rowspan="4">Training Programme on International Exposure & Professional Development programme on Social Responsibility & Effective Management</td><td>1</td><td rowspan="4">තායිලන්තය</td><td>දින 10</td></tr>
<tr><td>11</td><td>අධ්‍යක්ෂ, දේශිය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය</td><td>1</td><td>දින 10</td></tr>
<tr><td>11</td><td>සහකාර කොමසාරිස් (සංවර්ධන)</td><td>1</td><td>දින 10</td></tr>
<tr><td>12</td><td>සහකාර කොමසාරිස් (ආයතන)</td><td>1</td><td>දින 10</td></tr>
<tr><td>13</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරී</td><td>Overseas Training Programme for Postgraduate Scholars of Postgraduate Diploma Kayacikitsa/Panchakarma</td><td>10</td><td>ඉන්දියාව</td><td>දින 10</td></tr>
<tr><td>14</td><td>හෙද සොයුරිය</td><td>Seminar on Medical Equipment Research Development & Maintenance for Developing Countries</td><td>1</td><td>චීනය</td><td>දින 21</td></tr>
<tr><td>15</td><td>ආයුර්වේද වෛද්‍ය නිලධාරී</td><td>Training on Essential Oil, Perfumery & Aromatherapy FFDC</td><td>1</td><td>ඉන්දියාව</td><td>දින 07</td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | ප්‍රධාන ගණකාධිකාරී | Public Financial Management Workshop for Accountants in Singapore from 03-07 September 2018 | 1 | සිංගප්පූරුව | දින 07 |
| 17 | ගණකාධිකාරී (වැටුප්) | | 1 | | |
| 18 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Foreign Study Tour M.Sc. Ayurvedic Hospital Management Programme (2017 Intake) | 9 | ජපානය | දින 10 |
| 19 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Training Programme on "Diversity, Documentation, Gene Banking and Database for Medical Plants'' for IORA Member Countries, 25th November 2018 to 01st December 2018, Laknow, India | 1 | ඉන්දියාව | දින 07 |
| 20 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | International Workshop on Drugs Development from Herbs and Marine Medicinal Materials, Vietman from 10 -12 December | 1 | වියට්නාමය | දින 5 |
| 21 | ආයුර්වේද කොමසාරිස් | World Ayurvedic Congress 2018 | 1 | ඉන්දියාව | දින 04 |
| | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | | 7 | | දින 05 |

**සංවර්ධන අංශය**

**ආයතනික කාර්යයන්**

- **හිසතෙල් ගෑමේ උත්සවය - 2018.04.15**

සිංහල සහ හින්දු අලුත් අවුරුදු නිමිති කොට පවත්වන හිසතෙල් ගෑමේ මහෝත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කථානායක ගරු දේශබන්ධු කරු ජයසූරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාගේ සහභාගීත්වයෙන් අත්තනගල්ල පුරාණ රජමහා විහාර භූමියේදී උත්සවශ්‍රීයෙන් පවත්වන ලදී.

**ආ) අනෙකුත් වැඩසටහන්**

**රෝගී ප්‍රතිකාර සේවා - ජංගම සායන**

| වැඩසටහන | සායනය පැවැත්වූ ආයතනය | පැවැත්වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල | 35 |
| | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල | 11 |
| | ආයුර්වේද රෝහල - අම්පාර | 17 |
| | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට | 12 |
| | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න | 06 |
| | බෝ නොවන රෝග ආයුර්වේද පර්යේෂණ රෝහල - නින්දවූර් | 01 |
| | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු (ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පවරනු ලැබූ) | 16 |
| | සම්බන්ධීකරණය කරන ලද මුළු වැඩසටහන් ගණන | 98 |

**අනෙකුත් සේවා**

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිලාභී/ ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| 1. | දේශීය පාන වර්ග ජනප්‍රිය කිරීමේ වැඩසටහන | 45,500 |
| 2. | නොමිලේ පැල ලබා දීම (රාජ්‍ය ආයතන, පාසල්, පන්සල් සඳහා) | 22,053 |
| 3. | ප්‍රදර්ශන | 21 |
| 4. | ඔසු උයන් නැරඹීම සඳහා ඉල්ලීම් | 19 |

**ඉදිකිරීම් ප්‍රගතිය**

| වැය විෂය | කාර්යය | මූල්‍ය ප්‍රතිපාදන (රු. මිළි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 2- 1-2104 | 2 අදියරේ ඉදිකිරීම් කටයුතු- ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල | 356.2 | 337.890 | සැලසුම් කරන ලද ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත |
| 2-3-2104 | ඖෂධාලය ඉදිකිරීම- ආයුර්වේද ශික්ෂණ රෝහල - කයිතඩි | 11.66 | 11.65 | |
| 2- 5-2104 | සිද්ධ වෛද්‍ය ශික්ෂණ රෝහල -ත්‍රිකුණාමලය | .244 | | සංශෝධිත ඇස්තමේන්තු මුදල කැබිනට් අනුමැතියට යොමු කර ඇත. මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන ආයතනයෙන් සැලැස්මක් කැඳවා ඇත. |
| 2-2104 | ප්‍රජා සෞඛ්‍ය කාර්යාල ඉදි කිරීම | 35 | 16.238 | රඹෑව ප්‍රජා සෞඛ්‍ය කාර්යාල ඉදි කිරීම - 85%<br>තිරප්පනේ ප්‍රජා සෞඛ්‍ය කාර්යාලය ඉදි කිරීම -60%<br>නාච්චදූව ප්‍රජා සෞඛ්‍ය කාර්යාලය ඉදි කිරීම - 70% |
| 4-2104 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | 2 | - | ප්‍රතිපාදන පවරා ඇති අතර අක් මුදල් ලැබී නොමැත. |
| | නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම, ටයිල් කිරීම සහ සිවිලිම | | | භෞතික ප්‍රගතිය - 100% |
| 5-2104 | ඔසු උයන් | 6 | 5.9 | |
| | පට්ටිපොල ඔසු උයන | | | භෞතික ප්‍රගතිය - 80% |

අලුත්වැඩියා කටයුතු ප්‍රගතිය

| වැය විෂය | කාර්යය | මුල්‍ය ප්‍රතිපාදන (රු. මිලි.) | මුල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1-2001 | ප්‍රධාන කාර්යාලය | 2.5 | 1.9 | 100% |
| 2-2001 | ශික්ෂණ රෝහල් | 65 | 19.95 | ප්‍රතිපාදන පවරා ඇති අතර අක් මුදල් ලැබීනොමැත |
| | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරුල්ල | | | 80% |
| | ගමපහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල | | | 75% |
| | ආයුර්වේද ශික්ෂණ රෝහල - කයිතඩි | | | 70% |
| | ආයුර්වේද රෝහල - මන්වන්තුඩුවායි | | | 100% |
| | ආයුර්වේද රෝහල - අම්පාර | | | 100% |
| 3-2001 | පර්යේෂණ රෝහල් | 32 | 15.8 | ප්‍රතිපාදන පවරා ඇති අතර අක් මුදල් ලැබීනොමැත |
| | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට | | | 100% |
| | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න | | | 90% |
| 4-2001 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | 14 | 0.083 | 100% |
| 5-2001 | ඔසු උයන් | 6 | 5.338 | 2017 අක් මුදල් නොලැබීම් වලට හිඟ මුදල් ගෙවා ඇත |

ඔසු ගොවි ව්‍යාපෘතිය



මෙම ව්‍යාපෘතිය යටතේ වගා ක්ෂේත්‍ර ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අවසන් කිරීම.

**ක්ෂේත්‍ර වටා ආරක්ෂිත වැටවල් ඉදි කිරීම**

අක්මීමන - ගල්ගමුව

කහටගස්දිගිලිය - ඇටවීරගොල්ල

පොල්පිතිගම - රාවා ඇළ වගා



**ලිං ඉදි කිරීම** - පොල්පිතිගම - බෝගොල්ල
කහටගස්දිගිලිය - ඇටවීරගොල්ල

**ඖෂධීය වගා ක්ෂේත්‍ර ස්ථාපනය සඳහා කටයුතු කිරීම**

(අ) හල්දුම්මුල්ල, පට්ටිපොළ, ගිරාදුරුකෝට්ටෙ හා පින්නදූව ඔසු උයන්වලින් රෝපණ ද්‍රව්‍ය සකස් කර වගා ක්ෂේත්‍ර වෙත බෙදා දීම.

සැවැන්දරා, රත්නිටුල්, බැබිල, ඉඟුරු පියලි, කිරිබදු, මලිත, හීං අරත්ත, ඉරිවේරිය, හාතවාරිය, බුළු, ගම්මාළු, අංකෙන්ද, මී, මහුල් කරඳ, කරාබු, කරපිංචා, බෙලි, නා,රුක්, නෙල්ලි, බෙහෙත් බැබිල





බීජ ලබාදීම - කටුවැල් බටු, තිරස්වාලු, නිල් අවරිය, සෙනෙහෙකොළ, කපු, කිනිස්ස, අමුක්කරා වගා ක්ෂේත්‍ර ආරම්භ කර ඇති ස්ථාන



i. පදවිය - (දේශීය වී වර්ග ඇතුළුව ඖෂධීය ශාක)
ii. අලව්ව - ගලතරය
iii. පොල්පිතිගම - රාවා ඇල
iv. පොල්පිතිගම - බෝගොල්ල



.

අක්මීමන හා කහටගස්දිගිලිය පැල තවාන් ස්ථාපිත කර ඇති අතර ක්ෂේත්‍ර වගාවන් ලබන වසර මුල් කාලයේදී සිදු කිරීමට අපේක්ෂිතයි

**BACC ව්‍යාපෘතිය**

1. ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පහළ ගිරිබාව හා වන්නිකුඩාවැව ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි ගෙවතු 100ක් සංවර්ධනය සඳහා එක් ගෙවත්තකට ඖෂධීය ශාක 20 බැගින් බෙදා දීම. (2018.11.10 හා 11)

2. ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගිරිබාව කණිෂ්ඨ විදුහලේදී 2018.12.20 දින පැවති ඖෂධීය ශාක හඳුනාගැනීම හා භාවිතයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ ~ජෛව විවිධත්ව පොළ~ සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් දැනුවත් කිරීම් සිදු කිරීම.

3. ජෛව විවිධත්ව ලේඛනය ( Community Biodiversity Register) සකස් කිරීමට අදාළව ඖෂධීය ශාක ඡායාරූප හා තොරතුරු රැස් කිරීම හා රැස් කර ඇති තොරතුරු නැවත සාකච්ඡා කිරීම මඟින් ලේඛනය යාවත්කාලීන කිරීම. (2018.11.21)

4. ඖෂධීය ශාක ඇසුරින් ස්වයං රැකියා සඳහා නිෂ්පාදන හඳුන්දීමේ වැඩසටහන යටතේ පහළ ගිරිබාව හා වන්නිකුඩා වැව ගම්වැසියන් 33ක් සඳහා මදුරුනාශක හඳුන්කූරු නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම. (2018.11.22)

5. පහළ ගිරිබාව හා වන්නිකුඩාවැව ගම්මාන දෙකෙහි ඖෂධීය ශාක වගාවන් හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම හා ඉඩම් හා ගොවීන් 35ක් හඳුනාගැනීම. (2018.11.20 හා 21)

6. ගිරිබාව, මිල්ලනිය හා උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහි ග්‍රාම නිලධාරී වසම් 09ක සිදු කරන ලද ඖෂධීය ශාක පිළිබඳ ගෙවතු සමීක්ෂණ ඇසුරින් සකස් කරන ලද ග්‍රන්ථ 03 මුද්‍රණය සඳහා පැලැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ පිහිටි ව්‍යාපෘති කාර්යාලය වෙත භාරදීම.

7. ගෙවතු සමීක්ෂණ ඇසුරින් හඳුනාගත් ඌන භාවිතා ඖෂධීය ශාක 50ක් පිළිබඳ ශාක සංග්‍රහය සකස් කිරීම සඳහා තෝරා ගත් සම්පත්දායකයන් විසින් ශාකයේ උද්භිද විද්‍යාත්මක හඳුනාගැනීම, රසායනික සංඝටක ඒවා ආශ්‍රිත පර්යේෂණ, ඖෂධීය ගුණ භාවිතයෙන්, කෘෂි විද්‍යාත්මක තොරතුරු හා වෙනත් තොරතුරු යටතේ ලිපි රචනා කිරීම ආරම්භ කිරීම.

**ශිල්පීය අංශය**

**ආයුර්වේද සමාගම් ලියාපදිංචි කිරීම / බලපත්‍ර නිකුත් කිරීම/නිර්දේශ කිරීම**

| කාරණය | ලියාපදිංචි කළ ආයතන සංඛ්‍යාව | ලැබූ ආදායම (රු.) |
| | | | පැළ ප්‍රමාණය | වටිනාකම (රු.) |
| 1. | පින්නදූව | 16,379 | 7,488 | 373,895.00 |
| 2. | පට්ටිපොළ | 3,661 | 1,219 | 52,260.00 |
| 3. | පල්ලෙකැලේ | 18,929 | 15,486 | 49,0070.00 |
| 4. | හල්දුම්මුල්ල | 28,388 | 11,834 | 459,200.00 |
| 5. | නාවින්න | 5,533 | 7,899 | 353,830.00 |
| 6. | ගිරාඳුරුකෝට්ටේ | 31,174 | 614 | 86,840.00 |
| | එකතුව | **104,064** | **44,540** | **1,816,095.00** |

ඔසු උයන් මඟින් ලබා දෙන සේවාවන්

ප්‍රකාශන හා පොත්පත්

| අනු අංකය | ඔසු උයන | ප්‍රමාණය | ආදායම |
|---|---|---|---|
| 1. | පින්නදූව | 110 | 1100.00 |
| 2. | පල්ලෙකැලේ | 23 | 230.00 |
| 3. | හල්දුම්මුල්ල | 80 | 800.00 |
| 4. | නාවින්න | 31 | 310.00 |
| එකතුව | | **244** | **2440.00** |

විවිධ ආදායම්

| අනු අංකය | ඔසු උයන | වටිනාකම (රු.) |
|---|---|---|
| 1. | කුලියට දීම - සංචාරක බංගලා/ නේවාසිකාගාර/දේශන ශාලා/නිවාඩු නිකේතන | |
| | හල්දුම්මුල්ල | 537,000.00 |
| | පට්ටිපොළ | 334,500.00 |
| | ගිරාඳුරුකෝට්ටේ | 70,800.00 |
| | කතරගම | 155,800.00 |
| 2. | **වෙනත්** | |
| | **පට්ටිපොළ ඔසු උයන** | |
| | සංචාරක නිවාසයේ ඇඳ ඇතිරිලි ලබාදීම වෙනුවෙන් ලත් මුදල් | 17,670.00 |

**සමාජ සත්කාර කාර්යයන්**

- ඔසු උයන් 07 මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් 190ක්ද, වැඩමුළු 09ක්ද, ප්‍රදර්ශන 10ක්ද , තාක්ෂණික වගා උපදෙස් වැඩසටහන් 812ක්ද පවත්වා ඇත.
- පට්ටිපොළ ඔසු උයනේ අතුරු නිෂ්පාදන ලෙස මල් අලෙවියෙන් රු. 11,795.00ක ආදායමක් ලබා ඇත.

**නොමිලේ පැළ/ අමුද්‍රව්‍ය නිකුත් කිරීම්**

| අනු අංකය | ඔසු උයන | නොමිලේ පැළ නිකුත් කිරීම් | | ඔසු උයන් අතර පැළ හුවමාරුව | |
|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම (රු.) | ප්‍රමාණය | වටිනාකම (රු.) |
| 1 | පින්නදූව | 36,623 | 109,930.00 | - | - |
| 2 | පට්ටිපොළ | 2,031 | 68,800.00 | 1,381 | 44,930.00 |
| 3 | පල්ලෙකැලේ | 7,631 | 235,110.00 | - | - |
| 4 | ගිරාදුරුකෝට්ටේ | 6,079 | 195,450.00 | - | - |
| 5 | නාවින්න | 6,258 | 202,970.00 | - | - |
| 6 | හල්දුම්මුල්ල | 8,047 | 243,310.00 | - | - |
| | එකතුව | **66,669** | **1,055,570.00** | **1,381** | **44,930.00** |

**විශේෂ ව්‍යාපෘති (ගොවි සහභාගිත්ව වැඩසටහන/ ඔසු ගොවි වැඩසටහන) සඳහා නිකුත් කළ පැළ වර්ගයන්**

| අනු අංකය | ඖෂධ වර්ගය | හල්දුම්මුල්ල | පට්ටිපොළ | පින්නදූව |
|---|---|---|---|---|
| 1. | අමුක්කරා | 325 | - | 1400 |
| 2. | තිරස්තවාලු | බීජ 200 | - | 565 |
| 3. | කපුකිණිස්ස | බීජ 600 | - | 340 |
| 4. | හීංඅරත්ත | 1000 | - | - |
| 5. | වදකහ | - | 950 | - |

**විශේෂ ව්‍යාපෘති (ගොවි සහභාගිත්ව වැඩසටහන) සඳහා නිකුත් කළ පැළ ප්‍රමාණයන්**

| ව්‍යාපෘතියේ නම | පැළ ප්‍රමාණය | වටිනාකම (රු.) |
|---|---|---|
| **පින්නදූව ඔසු උයන** | | |
| ගොවි සහභාගිත්ව ඔසු වගා ව්‍යාපෘතිය | 1400 | 43,000.00 |
| ඔසු ගොවි වැඩසටහන -මතුගම | 565 | 18,950.00 |
| ඔසු ගොවි වැඩසටහන | 340 | 11,400.00 |
| **නාවින්න ඔසු උයන** | | |
| BACC ව්‍යාපෘති | 107 | 11,050.00 |
| ඔසු ගොවි වැඩසටහන | 86 | 3,560.00 |
| **පල්ලේකැලේ ඔසු උයන** | | |
| BACC ව්‍යාපෘති | 1,085 | 33,150.00 |

**පර්යේෂණ - අභ්‍යන්තර**

| | පර්යේෂණ මාතෘකාව | සමායෝජක නිලධාරි | අදාළ විස්තර |
|---|---|---|---|
| | **පින්නදූව ඔසු උයන** | | |
| 1 | නේත්‍රාපළම් කෙසෙල් බාහිර පරිසරයට හුරු කිරීම | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත. |
| 2 | දැත්ත බීජ ජීවානුහරණය | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත |
| 3 | අල බෙහෙත් බාහිර පරිසරයට හුරු කිරීම | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත |
| 4 | රත් හඳුන් අග්‍රස්ථ අංකුර ජීවානුහරණය | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත |
| 5 | කුංකුම ජීවානුහරණය | සී.එස්. හෙට්ටිආරච්චි | පර්යේෂණ මටට්මේ ඇත. |
| 6 | මස්බැද්ද කඳන් කැබලි ජීවානුහරණය | සී.එස්. හෙට්ටිආරච්චි | පර්යේෂණ මටට්මේ ඇත. |
| 7 | අල බෙහෙත් ගුණනය | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත |
| 8 | කෝමාරිකා බාහිර පරිසරයට හුරු කිරීම | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත |
| 9 | රත් මිල්ල ජීවානුහරණය | සී.එස්. හෙට්ටිආරච්චි | පර්යේෂණ මටට්මේ ඇත |
| 10 | රුක් අගුණ අංකුර ජීවානුහරණය | සී.එස්. හෙට්ටිආරච්චි | පර්යේෂණ මටට්මේ ඇත |

## 8.5 අනුරාධපුර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය

දේශීය වෛද්‍ය අංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 පුරා ක්‍රියාත්මක වන්නා වූ රෝග නිවාරණ වැඩසටහනකි. 2001 වර්ෂයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රිකකයේ මෙය ආරම්භ කරන ලද අතර දැනට ස්ථිර සේවාවක් බවට පත්ව ඇත. මෙහි අරමුණ වනුයේ ආයුර්වේද ජීවන දර්ශනය තුළින් කායික, මානසික, සමාජයීය,ආධ්‍යාත්මික හා ආර්ථික වශයෙන් සමෘද්ධිමත් ප්‍රජාවක් සිරිලක තුළ බිහි කිරීමයි.

**කාර්ය මණ්ඩල තොරතුරු**

| | |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් | 24 |
| සංවර්ධන සහකාර(කෘෂි) නිලධාරීන් අනුයුක්ත | 03 |
| ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් | 204 |
| කළමනාකරණ සහකාර | 01 |
| රියදුරු | 01 |
| ආයුර්වේද සේවා සහයක (අනුයුක්ත) | 02 |



**බෝ නොවන රෝග පාලන වැඩසටහන**



**පෝෂණ වැඩසටහන්**

මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතර, පහත වැඩසටහන් ප්‍රමුඛතාවයෙහිලා සැලකේ.

අනුරාධපුර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - **2018** දෙසැම්බර් **31** දිනට ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් විස්තරය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 1. | බෝ නොවන රෝග පාලනය | 1.ජංගම වෛද්‍ය සායන | 318 | |
| | | ප්‍රතිකාර කළ රෝගීන් සංඛ්‍යාව | 6,391 | |
| | | යොමු කළ රෝගීන් සංඛ්‍යාව | 307 | |
| | | 2. රෝගීන් හඳුනාගැනීමේ මූලික පරීක්ෂණ | 569 | 16,674 |
| | | 3. රාජකාරි සේවා ස්ථාන ආශ්‍රිත සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | 220 | 4,597 |
| | | 4. යෝග සහ සංයම අභ්‍යාස තුළින් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය | 177 | 2,233 |
| | | 5. දැනුවත් කිරීමේ වැඩසටහන් | 3,975 | 74,796 |
| | | 6. ආවේක්ෂණය කළ රෝගීන් සංඛ්‍යාව | 2,768 | |
| 2. | බෝ වන රෝග පාලන වැඩසටහන | බෝ වන රෝග පාලන වැඩසටහන් | 2,803 | 44,713 |
| 3. | පෝෂණ වැඩසටහන | දේශීය ආහාර ප්‍රචලිත කිරීම/ශ්‍රී ලාංකිකයන් සඳහා සුදුසු පෝෂණ සංකල්ප ප්‍රවර්ධන වැඩසටහන | | |
| | | 1.ප්‍රායෝගික වැඩසටහන් | 2,058 | |
| | | 2.දැනුවත් කිරීමේ වැඩසටහන් | 2,641 | |
| 4. | ළමා සෞඛ්‍ය සංරක්ෂණය | ළමා සෞඛ්‍ය සංරක්ෂණ පෙර පාසල්/පාසල් ස්වස්ථවෘත වැඩසටහන | | |
| | | 1. ළමා ස්වස්ථතා ප්‍රවර්ධන වැඩසටහන් | 1,755 | |
| | | 4. ළමා සායන | 741 | |
| | | 5. දැනුවක් කිරීමේ වැඩසටහන් | 1,384 | |
| 5. | ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවා වැඩසටහන | වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන | | 14,947 |
| | | 1.සායන සංඛ්‍යාව | 614 | |
| | | 2.අධීක්ෂණය කළ වැඩිහිටියන් සංඛ්‍යාව | 17,939 | |
| | | 3.වැඩිදුර ප්‍රතිකාර මධ්‍යස්ථාන කරා යොමු කිරීමේ සංඛ්‍යාව | 796 | |
| 6. | මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන | මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | 203 | 5,641 |
| 7. | මාතෘ සංරක්ෂණය | මාතෘ සායන | 206 | 2,258 |
| 8. | පාසල් වැඩසටහන් | 1. පාසල් සිසුන් සහ ආචාර්ය මණ්ඩලය දැනුවත් කිරීම | 151 | 9,190 |
| | | 2. 5 වසර ශිෂ්‍යත්ව උපකාරක වැඩසටහන් | 86 | 4,587 |
| | | 3. පාසල් ආශ්‍රිත සායනික සේවා වැඩසටහන | 36 | 1,515 |
| | | 4. යෝග හා සංයම අභ්‍යාස වැඩසටහන | 369 | 653 |
| 9. | ගෘහ ඒකක දැනුවත් කිරීම | ගෘහ ඒකක දැනුවත් කිරීම | 43,461 | 62,114 |
| 10. | ප්‍රජා සත්කාරක සේවා වැඩසටහන් හා වෙනත් විශේෂ වැඩසටහන් | 1.බෝ වන රෝග පාලනය/වෙනත් විශේෂ වැඩසටහන් | 755 | 10,556 |
| | | 2.විශේෂ වකුගඩු සායනය/බෝ නොවන රෝග පාලනය | 132 | 1,851 |
| | | 3.අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 19 | 251 |
| 11. | ඖෂධ පැලෑටි සංරක්ෂණය හා තිරසර භාවිතය | 1. ආදර්ශ පැල තවාන් | 53 | |
| | | 2.කාබනික ගෙවතු වගා වැඩසටහන් සංඛ්‍යාව | 558 | 5,168 |
| | | .ගෙවතු සංඛ්‍යාව | 2,471 | |
| | | 3.ඔසු උයන් (පාසල්/රාජ්‍ය ආයතන/වෙනත්) | | |
| | | ඔසු උයන් සංඛ්‍යාව | 207 | |

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

## 09. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**දැක්ම**

සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩනැගීමේදී ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පවතින අවශ්‍යතා උසස් ප්‍රමිතියකින් යුක්තව සපුරාලන අතරතුර දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් සේවා සැපයුම මූලික කොටගත් ප්‍රමුඛයකු බවට පත්වීම.

**මෙහෙවර**

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරලමින් සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි මස 11 වන දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් ගරු කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍ය පිලිප් ගුණවර්ධන මැතිතුමා විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කරන ලදී.

**සංස්ථාවේ ප්‍රධාන අරමුණු**

1. ආයුර්වේද ඖෂධ උසස් ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කිරීම.
2. රාජ්‍ය අංශයේ සියළුම ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා හා නිදහස් ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට ඖෂධ සපයන ප්‍රධාන සැපයුම්කරු වීම.
3. ආයුර්වේද, සිද්ධ, යුනානි ඖෂධවලට අමුද්‍රව්‍ය ආනයනය හා දේශීය වෙළඳපොළ අවශ්‍යතාවයට අලෙවි කිරීම.
4. තරඟකාරී පෞද්ගලික වෙළඳපොල ඉලක්ක කොට, ගුණාත්මකභාවයෙන් සපිරි දේශීය ඖෂධ නිෂ්පාදනය කොට ප්‍රජාව වෙත ප්‍රචලිත කිරීම.
5. දේශීයව නිපදවන අමුද්‍රව්‍ය සහතික මිල ගණන්වලට මිලදී ගැනීම, ගබඩා කිරීම හා සාධාරණ මිලට අලෙවි කිරීම මඟින් නිෂ්පාදක ගොවීන්ට උපරිම මිලක් ලබා ගැනීම.
6. ඖෂධ පැලෑටි සංරක්ෂණය කිරීම සහ වගාවන් ව්‍යාප්ත කිරීම.
7. ඖෂධ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සඳහා පර්යේෂණය කිරීම හා එබඳු ඖෂධ වර්ග ප්‍රමිතිගත කිරීම.
8. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය එහෙත් නීතියෙන් තහනම් ඖෂධ නීත්‍යානුකූලව ලබාගෙන ඖෂධ නිෂ්පාදනය කරනු ලබන වෛද්‍යවරුන්ට නීත්‍යානුකූලවම ලබාදීම මඟින් පාරම්පරික වෛද්‍ය ක්‍රමය රැකගැනීමට ක්‍රියාකිරීම.

සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | **සිව් මහල් ගබඩා සංකීර්ණය ඉදි කිරීම -** මෙය වර්ග අඩි 28,500 කින් යුක්තවන අතර භූගත මහලේ වියළි අමුද්‍රව්‍ය, හිස් බෝතල්, සීනි, ප්ලාස්ටික් ඇසුරුම් වැනි ද්‍රව්‍ය ගබඩා කර ඇත. බිම් මහලේ රාජ්‍ය අංශයට බෙදා හරින සියළුම නිමි ඖෂධත්, 1 වන මහල තුළ රසායනාගාරය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ ලේබල් ගබඩාව ස්ථාපනය කර ඇති අතර 2 වන මහල තුළ සේවක විවේකාගාර දෙකක් ස්ථාපිත කර ඇත. 3 වන මහල තුළ බහුකාර්ය දේශන ශාලාව සහ ගිණුම් අංශය ස්ථාපනය කර ඇත | 157.00 | 100% | 95% |
| 02 | **ප්‍රධාන නිෂ්පාදනාගාරයේ වහල නවීකරණය කිරීම -** රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදෙස් අනුව වහළ ප්‍රතිසංස්කරණය කිරීම සිදු කෙරිණ. මෙම වහළ ප්‍රතිසංස්කරණය කිරීමෙන් වහලේ අලංකාරය පමණක් නොව දිගු කල් පැවැත්මට ද යහපත් නිෂ්පාදන පිළිවෙත් අනුව ඖෂධ නිෂ්පාදනයට ද ඉවහල් වේ | 34.78 | 100% | 95% |
| 03 | **ආයතන පරිශ්‍රයේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීම -** ප්‍රධාන නිෂ්පාදනාගාරය පිහිටි ආයතන පරිශ්‍රයේ පවිත්‍රතාවය පවත්වාගෙන යාම සඳහාත් අලංකරණය සඳහාත් ඉන්ටර්ලොක් ගල් ඇතිරීම. | 5.8 | 100% | 95% |
| 04 | **විදුලිය බෙදාහැරීමේ නව පද්ධතියක් නිර්මාණය කිරීම** ප්‍රධාන නිෂ්පාදනාගාරයට, සිව්මහල් ගබඩා සංකීර්ණයට හා කාර්යාල ගොඩනැගිලි සඳහා අවශ්‍ය බල ශක්තිය බාධාවකින් තොරව ලාබාදීම සඳහා මෙම පද්ධතිය නිර්මාණය කර ඇත. එහි දෙවන පියවර ලෙස පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිතව ඇත. | 0.96 | 100% | 20% |
| 5 | **රස බෙහෙත් නිෂ්පාදනය -** ආයුර්වේද ඖෂධ සංස්ථාව රස බෙහෙත් නිෂ්පාදනයේ ඉදිරියෙන් සිටිය ද තවමත් ඉල්ලුමට ගැලපෙන අයුරින් සැපයුමක් කිරීමට සමත් වී නොමැත. දැනට නිෂ්පාදනය කරනුයේ රුපියල් කෝටියක (රු.මි.10) නිෂ්පාදන පිරිවැය වටිනාකමකින් යුතු රස බෙහෙත් වර්ග පමණි. රස ඖෂධ සඳහා ලබා ගන්නා සියළු ඖෂධයන් පෘථිවි තලයෙන් (Elements of Earth) ලබා ගන්නා ද වෙති. ඒවා අතර රසදිය (Mercury), ගෙන්දගම් (Sulphur), මනෝසිල (Arsenic Bisulphite), සාදිලිංගම් (Vermilion), රන්හිරියල්(Arsenic trisulphide) සහ රත්‍රන් (Aurum/Gold) ප්‍රධාන මූල ද්‍රව්‍ය වේ. ඉහත කී සියළු ඖෂධ වර්ග විශේෂිත වූ ක්‍රමවේද භාවිතයට ගනිමින් විෂ රහිත ගුණ ඇති ඖෂධ බවට පත් කර රස බෙහෙත් නිෂ්පාදනය කිරීම. | 42.5 | 5% | - |

**2017 හා 2018 වර්ෂ වල ක්‍රියාත්මක ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතිය | ආයෝජනය (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | **බෙහෙත් වියළීමේ යන්ත්‍ර (Electric Tray Driers) 3ක් මිලදී ගැනීම -** රස වටිකා අංශයේ රස ඖෂධ වියළීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහාත් නව නිෂ්පාදනාගාරයේ ඖෂධ පෙති නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වියළා ගැනීම සඳහාත් විදුලියෙන් ක්‍රියා කරන මෙම වියළන යන්ත්‍ර 03 මිල දී ගන්නා ලදී. එම යන්ත්‍ර 03න් 02ක් ප්‍රධාන නිෂ්පාදනාගාරයේ රස වටිකා අංශය තුළත් අනෙක් යන්ත්‍රය නව නිෂ්පාදනාගාරය තුළත් ස්ථාපනය කර ඇත. | 4.14 | 100% | 100% |
| 02 | **රස බෙහෙත් ඇඹරුම් යන්ත්‍ර ( End Runner Mills) 4ක් මිල දී ගැනීම**<br>රස වටිකා අංශයේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා මෙම ඇඹරුම් ගල් 04 මිල දී ගත් අතර රස බෙහෙත් ඇඹරීමේ ක්‍රියාවලිය සඳහා මේවා භාවිතයට එක් කර ඇත. | 8.835 | 100% | 95% |
| 03 | **අට්ටි ගැසීමේ යන්ත්‍ර (Electric Stackers) 2ක් මිල දී ගැනීම -** නිෂ්පාදනාගාරයේ සහ නව සිව් මහල් ගබඩා සංකීර්ණයේ ද්‍රව්‍ය/ භාණ්ඩ පහසුවෙන් හැසිරවීම (Material Handling) සඳහා මෙම යන්ත්‍ර 2018 වර්ෂයේ දී මිල දී ගත් අතර මෙහෙයුම් කටයුතු සඳහා සාර්ථකව යොදා ගැනේ. | 2.53 | 100% | 95% |
| 04 | **හයිඩ්‍රොලික් උත්තෝලකයක් ( Hydraulic Lift) මිලදී ගැනීම -** නිෂ්පාදනාගාරය තුළ නිෂ්පාදනය කරන නිමි ඖෂධ ට්‍රොලි වල බහා නව සිව් මහල් ගබඩාවේ බිම් මහලේ ගබඩා කිරීම සඳහා ගෙන යා යුතුය. එහි දී පොළොව මට්ටමේ සිට අඩි 06ක් පමණ උසට එකවර ට්‍රොලි 02ක් ඔසවා බිම්හලේ ස්ථානගත කිරීමට මෙම යන්ත්‍රය 2018 වර්ෂයේ දී මිල දී ගන්නා ලදී. එමඟින් නිමි ඖෂධ ගබඩා කිරීමේ කාර්යක්ෂමතාවය ඉහල ගොස් ඇත. | 4.134 | 100% | 95% |
| 05 | **උත්කර්ෂණ යන්ත්‍රයක්(Material Hoist)මිල දී ගැනීම -** සිව් මහල් ගබඩා සංකීර්ණයේ ඕනෑම මහලක් වෙත බඩු බාහිරාදිය ගෙන යාම සඳහා මෙම යන්ත්‍රය සිව්මහල් ගබඩා සංකීර්ණය තුළ ස්ථාපනය කර ඇත. | 3.223 | 100% | 20% |
| 06 | **විදුලියෙන් ක්‍රියාකරන Fork Lift යන්ත්‍රයක් මිලදී ගැනීම -** මෙය දූම විමෝචනය නොවන පරිසර හිතකාමී යන්ත්‍රයක් වේ. මෙමගින් සිව් මහල් ගබඩා සංකීර්ණයේ බිම් මහල තුළ අමුද්‍රව්‍ය ගබඩා කිරීම හැසිරවීමටත් කර්මාන්තශාලා පරිශ්‍රය තුළ අමුද්‍රව්‍ය සහ භාණ්ඩ හැසිර වීමටත් පහසුවෙන් යොදාගත හැක. | 4.134 | 100% | 95% |

### නිෂ්පාදන විවිධාංගීකරණය

පාරම්පරිකව පැවත එන ආයුර්වේද ඖෂධ වලට අමතරව සංස්ථා නිෂ්පාදන පෙළ දිගු කරමින් නව නිෂ්පාදන 6ක් 2018.08.06 දින වෙළඳපොලට හඳුන්වා දෙනු ලැබීය. වෙනස් වන පාරිභෝගික අවශ්‍යතා හා පරිභෝජන රටා හඳුනා ගනිමින් සිදු කළ අධ්‍යනයන් හි ප්‍රතිඵලයක් ලෙස මෙම නිෂ්පාදන හඳුන්වා දෙනු ලැබීය.



















### අලෙවි ශාඛා පිහිටුවීම

සංස්ථා නිෂ්පාදන අලෙවිය ඉහළ නැංවීමේ අරමුණින් ආයුර්වේද සංස්ථා අලෙවි ශාඛා ජාලය පුළුල් කිරීම සිදු කෙරේ.

### අලුත්ගම අලෙවි ශාඛාව

කොළඹ සහ ගාල්ල අතර වූ එකම අලෙවි ශාඛාව 2018.03.08 දින සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අලුත්ගම නගර මධ්‍යයේ පිහිටුවනු ලැබීය.

2018.12.31 දිනට ශුද්ධ අලෙවි ආදායම රු. 2,106,357.00 කි.

**ජා - ඇල අලෙවි ශාඛාව**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සංස්ථා නිෂ්පාදන අලෙවිය වර්ධනය කිරීමේ අරමුණින් ජා-ඇල අලෙවි ශාඛාව පිහිටුවනු ලැබීය. 2018.09.25 දින සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම ශාඛාව විවෘත කෙරිණ.

2018.12.31 දිනට ශුද්ධ අලෙවි ආදායම රු. 801,620.00 කි.

**විශේෂ ව්‍යාපෘති**

**වියළි ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථානය - මොණරාගල**

ආයුර්වේද ඖෂධ සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග අතර වියළි ඖෂධ සපයා ගැනීම එක් අභියෝගයකි. ඒ අනුව මොණරාගල නගරයේ වියළි ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් 2018 වර්ෂයේ මැයි මස ආරම්භ කරන ලදී. අරළු, බුළු, නෙල්ලි, සැවැන්දරා, බිං කොහොඹ වැනි ඖෂධ ඌව පළාතේ බහුලව ඇත. ගොවීන්ගේ නිෂ්පාදන සහතික මිලකට ලබා ගැනීමෙන් ගොවීන්ට ආර්ථික වාසියක් අත් කෙරෙන අතරම සංස්ථාව අතරමැදියන් ගෙන් මිදීම ද මේ නිසා ඇති වන වාසියකි. මෙය තිරසාර සංවර්ධනයේ දිළිඳුකම පිටු දැකීම සඳහා වූ අපගේ සමාජ සත්කාර වැඩසටහනේ (CSR) තවත් එක් කොටසකි.

**පුනරුදය දින 60 මෙහෙයුම ආරම්භ කිරීම**

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සංවර්ධන ක්‍රියදාමයේ තවත් වැදගත් පරිච්ඡේදයක් ආරම්භ කරමින් 'පුනරුදය දින 60 මෙහෙයුම' සමාරම්භය 2018.06.25 දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී පැවති මාධ්‍ය හමුවත් සමග සිදු කෙරිණ. ඉදිරි දින 60ක් ඇතුළත සිදු කිරීමට නියමිත වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව මෙහි දී මාධ්‍ය ආයතන දැනුවත් කළ අතර සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම හමුව පැවැත්විණ.

**අලෙවි ප්‍රවර්ධන වැඩමුළු සංවිධානය**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඖෂධ අලෙවිය වැඩිකර ගැනීමේ අරමුණින් අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන තුළ සිදුකරමින් ආයුර්වේද ඖෂධ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩමුළු දිවයින පුරා සිදුකෙරිණි. ඒවායින් සංශිප්තයක් පහත පරිදි පෙළගස්වා ඇත.

| වැඩසටහන් පැවැත්වූ මාසය | පැවැත්වූ ආයතනය | පැවැත්වූ දිනය | ශුද්ධ ආදායම |
|---|---|---|---|
| පෙබරවාරි | ඔරේන්ජ් ඉලෙක්ට්‍රිකල්ස් (පුද්) සමාගම, මීගොඩ | 22.02.2018 | 5,265.00 |
| පෙබරවාරි | ගුවන් විදුලි සංස්ථාව | 23.02.2018 | 5,015.00 |
| පෙබරවාරි | ඉසුරුපාය, බත්තරමුල්ල | 23.02.2018 | 10,348.75 |
| පෙබරවාරි | විදේශ සේවා නියුක්ති කාර්යාලය, බත්තරමුල්ල | 27.02.2018 | 31,101.25 |
| මාර්තු | ජාතික සුව සේවා ප්‍රදර්ශනය, BMICH | 02,03 & 04.02.2018 | 142,050.00 |
| මාර්තු | Brandex, වැලිසර | 08.03.2018 | 6,665.00 |
| අප්‍රේල් | ආගමන විගමන ආයතනය | 23.04.2018 | 22,472.50 |
| මැයි | මග නැගුම ආයතනය | 09.05.2018 | 22,046.25 |
| මැයි | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | 17.05.2018 | 26,963.50 |
| මැයි | ඛණිජතෙල් නීතිගත සංස්ථාව | 18.05.2018 | 223,350.00 |
| ජූනි | Ayurveda Expo - 2018 | 13,14 & 15.07.2018 | 116,883.75 |
| ජූලි | ගම්පහ දුම්රිය ස්ථානය | 26.07.2018 | 234,596.55 |
| සැප්තැම්බර් | කටුනායක ආයෝජන මණ්ඩලය | 04.09.2018 | 12,376.50 |
| සැප්තැම්බර් | බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 24.08.2018 | 21,663.00 |
| සැප්තැම්බර් | AYUREX – 2018 Kandy City Center | 04.10.2018 | 61,852.50 |
| ඔක්තොම්බර් | ත්‍රිකුණාමලය ආයුර්වේද දෙපාර්තමේන්තුව | 05.06 & 07.10.2018 | 8,931.25 |
| ඔක්තොම්බර් | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 25.10.2018 | 8,986.50 |
| ඔක්තොම්බර් | අම්පාර | | |
| | එකතුව | | **960,567.30** |

**2018 සංස්ථාවේ වාර්ෂික නිෂ්පාදනය හා අලෙවි ප්‍රගතිය**

| විස්තරය | රු.මි. |
|---|---|
| වාර්ෂික නිෂ්පාදනය | 394.081 |
| මුළු ශුද්ධ විකුණුම් | 688.355 |



හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ

# හෝමියෝපති වෛද්‍ය ක්‍රමය

## 10. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය රෝගයට පමණක් නොව රෝග මූලයටද ප්‍රතිකාර කරනු ලබන සුවිශේෂී වෛද්‍ය ක්‍රමයකි. මෙය අතුරු ආබාධ රහිත ඖෂධ පාවිච්චියට ඉතා පහසු, ලාභදායී වෛද්‍ය ක්‍රමයකි. ශාක සත්ත්ව හා ලෝහ වැනි ස්වභාවික ද්‍රව්‍යවලින් නිෂ්පාදිත මෙම ඖෂධ භාවිතයෙන් ස්වභාවික ප්‍රතිශක්තිය ඉහළ යයි. ස්වභාවික ප්‍රතිශක්තිය ඉහළ දැමීම මඟින් රෝග සුව කරන මෙම ඖෂධ භාවිතයෙන් පුද්ගයාගේ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ යයි. ජර්මන් ජාතික සැමුවෙල් හානිමාන් නැමති වෛද්‍යවරයා විසින් අරඹන ලද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පවත්වාගෙන යාම හා ප්‍රචලිත කිරීමේ ප්‍රධාන ආයතනය වන්නේ 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ ස්ථාපිත කරන ලද වැලිසර අංක 94 දරණ ස්ථානයේ පිහිටි හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර ඒ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රථම හා එකම හෝමියෝපති රෝහල වැලිසර පිහිටි රජයේ හෝමියෝපති රෝහලයි. දේශීය වෛද්‍ය අංශය මඟින් වැලිසර රජයේ හෝමියෝපති රෝහල හා හෝමියෝපති වෛද්‍ය සභාව පාලනය වේ.

### 10.1 හෝමියෝපති රෝහල

**දැක්ම**

ශ්‍රී ලාංකිය සමස්ත ජනතාවගේ සංවර්ධනයට දායක විය හැකි සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම.

**මෙහෙවර**

ශ්‍රී ලාංකාවේ සියළුම ජනතාවට අඩුම වියදමකින් යුතුව, රෝග සමනය හා රෝග වලක්වා ගැනීමට පහසු හා ලාභදායික වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා වැලිසර හෝමියෝපති රෝහල මගින් ක්‍රියාකාරී වැඩසටහනක් ජනතාව අතරට ගෙනයාම .

වැලිසර රජයේ හෝමියෝපති රෝහල පිහිටුවා වසර 15 ක් මේ වන විට සපුරා ඇති අතර, මෙම රෝහල සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වේ. ලංකාවේ පිහිටි එකම හෝමියෝපති රෝහල වන, වැලිසර රජයේ හෝමියෝපති රෝහලෙහි සේවය ලබාගැනීමට දිවයිනේ නන් දෙසින් රෝගීන් පැමිණෙන අතර, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් විශ්වාසනීය ප්‍රතිකාර සේවයක්, මෙම රෝහලෙන් ලබාගත හැක. 2018 වසර සඳහා මිලියන 30 ක ප්‍රාග්ධන ප්‍රතිපාදනද, මිලියන 18 ක පුනරාවර්තන ප්‍රතිපාදනද, හෝමියෝපති රෝහලට ලැබී ඇත.

දෛනිකව රෝගීන් 150-200 ක් පමණ හෝමියෝපති රෝහලේ බාහිර රෝගී අංශයට ප්‍රතිකාර සඳහා පැමිණෙන අතර අභ්‍යන්තර රෝගී අංශයේ රෝගීන් 20 ක් සඳහා නේවාසික පහසුකම් පවතී. රෝගී ප්‍රතිකාර සේවාවන්ට අමතරව, ජංගම සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, වෛද්‍ය සභාව යටතේ පාලනය වන නිදහස් හෝමියෝපති සායන සඳහා ඖෂධ සැපයීම, විදේශීය සුදුසුකම් ලත් වෛද්‍යවරුන්ට සායනික පහසුකම් සැපයීම, ආදී සේවා පහසුකම් මෙම රෝහලෙන් සැපයේ.

බෝ නොවන රෝග වැළඳීමේ ප්‍රවණතාවය ඉහල යමින් පවතින අවධියක, ශරීරයේ ස්වභාවික ප්‍රතිශක්තිය ඉහල දැමීම මඟින් රෝග සුවකරන හෝමියෝපති ඖෂධීය ප්‍රතිකාරක ක්‍රමය අතුරු ආබාධවලින් තොර විකල්ප වෛද්‍ය ක්‍රමයකි. තවද ප්‍රතිජීවක මඟින් මර්ධනය කල නොහැකි වෛරස් රෝග සඳහාද

හෝමියෝපති ඖෂධ වඩාත් සුදුසුය. ශාක, සත්ත්ව, ලෝහ වැනි ස්වභාවික ද්‍රව්‍යවලින් නිෂ්පාදිත මෙම ඖෂධ, ලාභදායි අතර භාවිතයටද පහසුය.

**රෝහල් කාර්ය මණ්ඩලය**

වෛද්‍ය නිලධාරීන් 02 ක් ඇතුළුව කළමනාකරණ සහකාර, ඖෂධ සංයෝජක, උපස්ථායක, රියදුරු හා හෝමියෝපති සේවා සහායක යන නිලධාරීන් 12 කුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙහි සේවයේ යෙදී සිටී. නේවාසික හා බාහිර රෝගී අංශ මනාසේ ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටින බැවින් 2018 වසරේ අගභාගයේදී තාවකාලික පදනම යටතේ එක් වෛද්‍යවරියක් සේවයට බඳවාගෙන ඇත.

**2018 වසරේ ප්‍රතිකාරක සේවා ලබාදුන් රෝගීන් සංඛ්‍යාව**

| මාසය | 2018 | |
|---|---|---|
| | බාහිර | අභ්‍යන්තර |
| ජනවාරි | 2,368 | 4 |
| පෙබරවාරි | 2,658 | 7 |
| මාර්තු | 2,502 | 13 |
| අප්‍රේල් | 2,377 | 4 |
| මැයි | 2,363 | 8 |
| ජුනි | 2,348 | 10 |
| ජුලි | 2,803 | 14 |
| අගෝස්තු | 2,692 | 6 |
| සැප්තැම්බර් | 2,883 | 13 |
| ඔක්තෝම්බර් | 3,417 | 10 |
| නොවැම්බර් | 2,864 | 13 |
| දෙසැම්බර් | 2,671 | 4 |
| **එකතුව** | **34,314** | **106** |

**ජංගම සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්**

| දිනය | සායන පැවැත්වූ ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2018.01.21 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල ,හලාවත | 98 |
| 2018.02.18 | රදගුරු එඩ්මන්ඩ්පීරිස් විදුහල ,හලාවත | 136 |
| 2018.03.11 | රදගුරු එඩ්මන්ඩ්පීරිස් විදුහල ,හලාවත | 140 |
| 2018.03.24 | සිරි සිද්ධාර්ත්ථාරාම විහාරස්ථානය, පානදුර | 58 |
| 2018.05.12 | මජිඩ් ෆසල් පල්ලිය ,පෙරියමුල්ල, මීගමුව | 54 |
| 2018.06.12 | ජංගම පොලිස් මුරපල , කුරවලාන | 46 |
| 2018.08.29 | මොණරාගල Vision 2020 | 372 |

**රසායනාගාර සේවය**

එක් එක් රෝගියාට විශේෂිත වූ රෝග ලක්ෂණ පදනම් කර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේදී ඖෂධ නියම කරන නමුත්, රසායනාගාර පරීක්ෂණ මඟින් රෝගී තත්ත්වයන් විද්‍යාත්මකව තහවුරු කර ගනී. තවද බෝ නොවන රෝග පහසුවෙන් හඳුනාගැනීමට, රසායනාගාර පරීක්ෂණ පිටුවහලක් වේ. 2018 වසරේ රෝගීන් 1,118 රසායනාගාර සේවා පහසුකම් සපයා ඇත.

**හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපන කටයුතු**

ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය මඟින් ලබාදී ඇති හෝමියෝපති වෛද්‍ය ශිෂ්‍යත්ව යටතේ ශ්‍රී ලාංකික සිසුන් 06 දෙනෙකු 2018 වසරේ හෝමියෝපති උපාධි හැදෑරීමට කල්කටා ජාතික හෝමියෝපති ආයතනයට යොමු කර ඇත. තවද හෝමියෝපති උපාධිය හදාරා මෙරටට පැමිණි වෛද්‍යවරුන් 04 දෙනෙකු සඳහා සායනික පහසුකම් මෙම රෝහල යටතේ ලබා දී ඇත.

**ඖෂධ ආනයනය**

හෝමියෝපති රෝහලට හා නිදහස් හෝමියෝපති සායන සඳහා රු.මිලියන 1.528 ක හෝමියෝපති ඖෂධ , රාජ්‍ය ඖෂධ සංස්ථාව මඟින් ආනයනය කර ඇත.

**ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය**

ඉදිවෙමින් පවතින නිල නිවාස සංකීර්ණයේ ඉදිකිරිම් සඳහා රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන වැය කර ඇත. තවද යටිතල පහසුකම් සංවර්ධනය යටතේ රෝහල් පරිශ්‍රය වටා තාප්ප කොටස් ඉදිකිරීමට රු.මිලියන 3.6 හා ජල අවශ්‍යතා සපුරාගැනිමට රු.මිලියන 0.5 වැයකර ජල ටැංකි රඳවනයක් ඉදිකර ඇත.

**මොණරාගල Vision 2020**

ප්‍රථම Vision 2020 සංවර්ධන වැඩසටහන මොණරාගල පැවැත්වූ අතර,හෝමියෝපති රෝහල මඟින් එහි ප්‍රදර්ශන කුටියක් සංවිධානය කළ අතර රෝගීන් 372 සඳහා ප්‍රතිකාරක සේවා සපයා ඇත.



මොණරාගල Vision 2020



හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීමට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම

## 10.2 හෝමියෝපති වෛද්‍ය සභාව

### දැක්ම

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම.

### මෙහෙවර

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.

### රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය

2018 රජයේ හෝමියෝපති සායන - රෝගී සංඛ්‍යාල්ඛන

| සායනය | පැමිණි රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| දෙහිවල | 16,447 |
| පරකඩුව | 13,732 |
| මාතලේ | 10,533 |
| පාලමුනෙ | 8,182 |
| කුරුණෑගල | 11,349 |
| මොණරාගල | 4,768 |
| තෝලංගමුව | 16,078 |
| **එකතුව** | **81,089** |

### රජයේ හෝමියෝපති සායන කළමනාකරණය

2018 වසරේදී සායන කළමනාකරණයට අවශ්‍ය පහසුකම් ලෙස කාර්ය මණ්ඩල නඩත්තුව, බෙහෙත් සැපයීම, වෛද්‍ය උපකරණ ඇතුළු සායන උපකරණ ලබාදීම, සායනවල ජල, විදුලි හා සනීපාරක්ෂක සේවා පවත්වාගෙන යාමට අදාළ කටයුතු සිදු කරන ලදී.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් හෝමියෝපති වෛද්‍ය සභාව විසින් ජංගම සායන පවත්වනු ලබනු අතර වැලිසර හෝමියෝපති රෝහල මේවා සංවිධානය කිරීම කරනු ලබයි.

**හෝමියෝපති රෝහල සමඟ සංවිධානය කෙරෙන ජංගම සායන**

| දිනය | සායනය පැවැත්වූ ස්ථානය | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---|---|---|---|
| 2018.01.21 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල, හලාවත | 79 | 19 | 98 |
| 2018.02.18 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල, හලාවත | 103 | 33 | 136 |
| 2018.03.11 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල, හලාවත | 112 | 28 | 140 |
| 2018.03.24 | සිරි සිද්ධාර්ථාරාම විහාරස්ථානය, පානදුර | 39 | 19 | 58 |
| 2018.05.12 | මජීඩ් ෆසල් පල්ලිය, පෙරියමුල්ල, මීගමුව | 33 | 21 | 54 |
| 2018.06.12 | ජංගම පොලිස් මුරපල, කුරවලාන | 30 | 16 | 46 |

- හෝමියෝපති වෛද්‍ය සභාව විසින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන මඟින් ද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් වැඩ සටහන් සංවිධානය කෙරේ. දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩමුළු ,සම්මන්ත්‍රණ හා ජංගම සායන මෙයට අයත් වේ.

**දෙහිවල රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර ජංගම සායන සහ බාහිර වැඩ සටහන්**

1. දෙහිවල ගල්කිස්ස නගර සභාව සමග "පුරපති සැරිසර" සමාජ මෙහෙවර වැඩ සටහන යටතේ සම්මන්ත්‍රණ 5ක් සහ ජංගම සායන 5ක්, කොතලාවල පුර පාසල, නැදිමාල කැලේ පාසල, නැදිමාල ධර්මරාජ විහාරය, රත්මලාන ධර්මාරාම විදුහල, සදහම් විහාරය යන ස්ථාන වල පවත්වනු ලැබීය. මේවායින් රෝගීන් 490 දෙනෙකු ප්‍රතිකාර ගෙන ඇත.

2. **"සුව යාත්‍රා "සමාජ සත්කාර වැඩ සටහන.**

මෙම වැඩසටහන යටතේ දෙහිවල සායනය විසින් සම්මන්ත්‍රණ 5ක් සහ ජංගම සායන 5 ක් හසලක සුගතාරාමය, අඹන්ගොල්ල ශ්‍රී සුදර්ශනාරාම විහාරය, ඇල්පිටිය ජයබිම සේනාසන විහාරය, ඇල්පිටිය ශ්‍රී විජයාරාම විහාරය යන ස්ථාන වල දී පවත්වා ඇත. රෝගීන් 659 දෙනෙකු මෙම සායන 5න් ප්‍රතිකාර ලබා ගන්නා ලදී.

**තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්**

තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය මඟින් ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන්ව දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් තෝලංගමුව විහාරස්ථානයේ දී සායනයේ කාර්යභාර වෛද්‍යවරිය පැවැත්වීය. ව්‍යායාම් ද සහිතව පවත්වනු ලැබූ මෙම වැඩමුළු දෙක සඳහා 178 දෙනෙකු සහභාගී විය.

**පරකඩුව රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්**

පරකඩුව රජයේ හෝමියෝපති සායනය මඟින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ 3ක් සහ සායන 3ක් පවත්වනු ලැබීය. කිරිඇල්ල ශ්‍රී සරණාරාම විහාරය, දෙහෙරගොඩ එල්ලාවල පුරාණ විහාරස්ථානය හා මාතුගල ශ්‍රී රත්නාරාම විහාරස්ථානය යන ස්ථාන වල දී මෙම වැඩසටහන් පැවැත් වූ අතර රෝගීන් 126 දෙනෙකු මේවායින් ප්‍රතිකාර ගෙන ඇත.

**මොණරාගල රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩසටහන්**

2018 අගෝස්තු 29, 30, 31 යන දිනයන්හි මොණරාගල නගරයේ පැවැත් වූ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශන භූමියේ මොණරාගල රජයේ හෝමියෝපති සායනය විසින් හෝමියෝපති ප්‍රදර්ශන කුටියක් පවත්වා ගෙන යන ලදී. එම දින තුන තුළදී 3000ක පමණ පිරිසකට හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව අවබෝධයක් ලබා දුන් අතර, එම ප්‍රදර්ශන කුටිය තුළම පවත්වා ගෙන ගිය ප්‍රතිකාර සේවය තුළින් අළුත් රෝගීන් 372ක් ප්‍රතිකාර ලබා ගෙන තිබුණි .

**හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මාධ්‍ය වැඩසටහන්**

දෙහිවල සායනයේ කාර්යභාර වෛද්‍ය නිලධාරිනිය විසින් මෙම වසර තුළ රූපවාහිනී වැඩසටහන් 17ක් සහ ගුවන්විදුලි වැඩසටහන් 17ක් මඟින් හෝමියෝපති සම්බන්ධ ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කරන ලදී. පුවත්පත්වලට මෙම වෛද්‍යවරිය 2018 වසරේ දී පමණක් ලිපි 44ක් සපයා ඇත .

**හෝමියෝපති නව සායන සඳහා ස්ථාන ලබා ගැනීම සහ ගොඩනැගිලි අභිවර්ධනය කිරීම.**

| දිස්ත්‍රික්කය | ස්ථානය | ආයතනය |
|---|---|---|
| පුත්තලම | පුත්තලම M.O.H ගොඩනැගිල්ල | මහ නගර සභාව - පුත්තලම |
| හම්බන්තොට | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. |
| මඩකලපුව | මුනායි වීදිය, පුලියන්තිව්, මඩකලපුව | මඩකලපුව මහ නගර සභාව. |
| කළුතර | විදෙස් මිතුදම, මහ ඉංගිරිය | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| නුවරඑළිය | ආනන්ද දසනායක මාවත, නව නගරය, කොත්මලේ | කොත්මලේ ප්‍රා.ලේ .කාර්යාල |
| පොළොන්නරුව | මහජන පුස්තකාල ශ්‍රවනාගාරය තමන්කඩුව, පොළොන්නරුව | තමන්කඩුව ප්‍රාදේශීය සභාව |
| ගාල්ල | මහ මෝදර රෝහලෙන් ගොඩනැගිල්ලක් ඉල්ලා ඇත. | |

අමාත්‍යාංශ ලේකම්, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ සභාපති හා වෛද්‍ය සභා කාර්යාලය මඟින් රාජ්‍ය නිලධාරීන්ට සහ දේශපාලන අධිකාරීන්ට කරනු ලැබූ විවිධ ඉල්ලීම් වලට අනුව සායන 7 ක් ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික් 7 ක ස්ථාන ලබා ගැනීමට හැකියාව ලැබුණි. ඒවා පහත පරිදි වේ.

- පුත්තලම සායනය සඳහා මහ නගර සභාව විසින් ගොඩනැගිල්ල ලබා දී ඒ සඳහා අවශ්‍ය ගෘහ උපකරණද ලබා දෙන ලදී .හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල පසුගිය වසරේ අළුත්වැඩියා කළ අතර මෙම වසරේ දී රු. 411,199.00ක් වටිනා ගෘහ භාණ්ඩ සායනයට මිල දී ගැණුනි .

- ඉංගිරිය සායන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා රු 615,375.00 .ක් වැය කළ අතර ගෘහ උපකරණ මිලදී ගැනීම සහ නාම පුවරුව ඉදිකිරීම වෙනුවෙන් රු300,974.00 .ක් වැය කෙරුණි . කොත්මලේ සායන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම ඉදිරියට තිබියදීම සායනය විවෘත කිරීමට ක්‍රියා කරමින් රු 90,239.00 ක් වටිනා ගෘහ භාණ්ඩ සායනය වෙත ලබා දුනි .

**නව සායන සඳහා හෝමියෝපති වෛද්‍යවරුන් බඳවා ගැනීම.**

නව සායන 07 ක් සහ හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය සඳහා එක් අයෙක් වශයෙන් වෛද්‍යවරුන් 08 දෙනෙකු බඳවා ගැනීමට ලබා ගෙන තිබූ තනතුරු අනුමැතියට අනුව, හෝමියෝපති වෛද්‍ය සභාවේ හෝමියෝපති වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමට අයදුම් පත් කැඳවන ලදී. භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීම මගින් කරනු ලැබූ කැඳවීමට අනුව අයදුම්පත් 29 ක් ලැබුණි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැණුනු වෛද්‍යවරුන් 07 දෙනෙකු සඳහා පත්වීම් ප්‍රදානය කෙරුණි. පත්වීම් ලාභී හෝමියෝපති වෛද්‍ය නිලධාරීන් ගෙන් 07 දෙනෙකු හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් විය. එයින් එක් අයෙකු හෝමියෝපති ඩිප්ලෝමාධාරී වෛද්‍යවරයෙකි.

**නව සායන සඳහා කාර්යාල සහායකයින් (කම්කරුවන්) බඳවා ගැනීම.**

ආරම්භ කිරීමට නියමිත හෝමියෝපති නව සායන 07 සඳහා සායන අයත් වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල දැන්වීම් පළ කිරීම මගින් අයදුම් පත් කැඳවන ලදී. අයදුම්කරුවන් 26 දෙනෙකු අයදුම් පත් ඉදිරිපත් කර තිබුණි. තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් 07 දෙනෙකු තෝරා ගන්නා ලදී.

**හෝමියෝපති නව පනත බලාත්මක කිරීම.**

1970 අංක 07 දරණ පැරණි හෝමියෝපති පනත ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දුන් ප්‍රධානතම ගැටළු බවට පත්ව තිබුණේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස රෙගුලාසි සම්පාදනය වී නොතිබීමය. මෙම කරුණ ගැඹුරින් අවබෝධ කර ගැනීම මත 2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පත් වූ පළමු සභාව වූ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව වසර දෙකක නිල කාලය තුළ වැඩිපුරම අවධානය යොමු කලේ නව පනත බලාත්මක කිරීම සඳහා වන රෙගුලාසි සම්පාදනය කිරීම වෙනුවෙනි. 2017 වසරේ දී අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීය. මෙම වසරේ දී අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තු එක්ව අවශ්‍ය සංශෝධනයන් සිදුකර ඒවා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට හැකි විය.

**හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.**

එවකට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මෙහෙය වීම මත ශිෂ්‍යත්ව දිනා ඉන්දියාවේ දී හෝමියෝපති වෛද්‍ය උපාධිය ලබා ගත් හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරු 08 දෙනෙකු වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අයදුම් කර තිබුණි. එයින් 07 දෙනෙකු සඳහා ලියාපදිංචිය ලබා දීමට අතුරු වෛද්‍ය සභාව ක්‍රියා කළේය.

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ (1)30 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

නව පනතේ මෙම වගන්තිය අනුව වසර 5 කට වඩා හෝමියෝපති වෛද්‍ය කර්මයෙහි නියුක්තව සිටි අයව වෛද්‍ය සභාව මඟින් පවත්වනු ලබන විභාගයකින් සමත්ව, වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීමට අවස්ථාව සලසා තිබීම අනුව අදාළ විභාගය පැවැත්වීම සඳහා සුදුසු කම් සම්පූර්ණ කරන ලද අයගෙන් අයදුම්පත් කැඳවා තිබුණි . 189 දෙනෙකු ගෙන් යුතු මෙම අයදුම්කරුවන් වෙත විෂය නිර්දේශ හා අදාළ දැනුම් දීම් සිදු කිරීම විභාග නීති සකස් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යැවීම, විභාග මණ්ඩලයක් පත්කර එය අමාත්‍යාංශයේ විභාග අංශය සමඟ සම්බන්ධ කර විභාගය පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසීම යනා දී වශයෙන් වන මෙයට අදාළ කටයුතු මෙම වසර තුළ දී සම්පූර්ණ කිරීමට හැකි විය.

**හෝමියෝපති ඖෂධ ආනයනය 2018.**

මෙම වසර තුළදී හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසින් වෛද්‍යවරුන් 4 දෙනෙකු සඳහා අවස්ථා 10 කදී ඩොලර් 34,966.41 වටිනා සහ එක් වෛද්‍යවරයෙක් සඳහා යුරෝ 932 ක් වටිනා ඖෂධ ආනයනය සඳහා අනුමැතිය ලබා දුනි.

**හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ පහසුකම් අභිවර්ධනය කිරීම.**

හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ පහසුකම් අභිවර්ධනය කිරීම සඳහා මෙම වසරේදී ද ක්‍රියා කරන ලදී. එහි දී රු. 528,859.72 ක් වැය කර හෝමියෝපති වෛද්‍ය සභා ගොඩනැගිල්ල ඇළුමිනියම් සහ වීදුරු ජනෙල් දමා වායුසමනය කර නවීන පහසුකම් සහිත තත්ත්වයට වර්ධනය කරන ලදී. වෛද්‍ය සභා කාර්යාලයට ජලය ලබා ගැනීම සඳහා නව ජල ටැංකියක් සහ ජල ටැංකි ආධාරකයක් රු. 500,000.00 ක් වැය කර ඉදි කිරීමට ක්‍රියා කරනු ලැබීය.

**හෝමියෝපති නීති හා ආයතන පද්ධතිය පුළුල් කිරීම.**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින නීති රාමුව ප්‍රසාරණය කිරීමෙන්, ආයතන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීමේත් අවශ්‍යතාව හඳුනා ගත් හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ඒ සඳහා අවශ්‍ය කෙටුම් පත් සකස් කර හෝමියෝපති වෛද්‍යවරුන්ට ඉදිරිපත් කර අවශ්‍ය යෝජනා සංශෝධන සහිතව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. හෝමියෝපති වෛද්‍යවරුන් ඇතුළු 52 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මේ වෙනුවෙන් එක් දින වැඩමුළුවක් පවත් වන ලදී. එහිදී,

1. හෝමියෝපති ඖෂධ ආනයනය පිළිබඳ ප්‍රතිපත්ති යළි සැකසීම.
2. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිළිබඳ යෝජනාව
3. හෝමියෝපති දෙපාර්තමේන්තු පනත

යන පුළුල් යෝජනා 03 පිළිබඳව වෛද්‍යවරු වෙන වෙනම කණ්ඩායම් ලෙස සාකච්ඡා කර අවසන් කෙටුම්පත් සකස් කරන ලදී .